# කාර්ය සාධන වාර්තාව
# 2024

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

"සුහුරුපාය"
ශ්‍රී සුභූතිපුර පාර
බත්තරමුල්ල
ශ්‍රී ලංකාව

ප්‍රකාශනය: ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

.

CM 042299 - 30 (2025/05) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## ආගමන හා විගමන පාලක ජනරාල්ගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය උදෙසා දෙස් විදෙස් ආයෝජන ප්‍රවර්ධනය කිරිම තුළින් ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථික මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අපේක්ෂාව පෙරදැරි කර ගත් "සව්මත් අනාගතයකට පෙරවදනක්" තේමාවෙන් යුතු රජයේ ප්‍රතිපත්තිය සමඟ ඉදිරියටම ගමන් කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබේ.

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත් විමේ දැක්ම සාක්ෂාත් කර ගනු පිණිස කැප වී ක්‍රියා කරන ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පැවති අභියෝගාත්මක තත්ත්වයන් හමුවේ වුව ද, 2024 වර්ෂයේ අත්කර ගන්නා ලද ජයග්‍රහණයන් පිළිබඳව සඳහන් කර 2024 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට පණිවිඩයක් එක් කිරීමට ලැබිම භාග්‍යයක් කොට සලකමි.

රාජ්‍ය ප්‍රතිපත්ති අනුව යමින් සංචාරකයින් සඳහා මිත්‍රශීලී පිළිවෙතක් අනුගමනය කරනු වස් විදේශ විනිමය මෙරටට රැගෙන ඒමට දායක වන ප්‍රමුඛතම මාර්ගයක් වෙමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සෘජු ඩොලර් ආදායමක් උපයා දීමට සංචාරක වීසා නිකුත් කිරීමේ කාර්යය සමත් වී තිබේ. එමෙන්ම ශ්‍රී ලංකාව තුල ආයෝජනය කිරීමට ආයෝජකයන් ආකර්ශනය කරමින් දිර්ඝ කාලීන වාස වීසා නිකුත් කිරීමේ පහසුකම් ද සලසා තිබෙන අතර, වෙළඳ පොළ අවස්ථා වර්ධනය කිරීම සහ සංචාරක කටයුතු වැඩිදියුණු කරමින් ආගමන විගමන ක්‍රියාවලිය වඩාත් සුමට කිරීමට රටවල් 07ක් සඳහා සංචාරක වීසා නොමිලේ ලබා දීමට ක්‍රියා කිරීම ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය. තවද 1994 වර්ෂයේ දී නතර කරන ලද ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ගමනාගමන කටයුතු ඉන්දියාවේ නාගපට්නම් වරායේ සිට කන්කසන්තුරේ වරාය දක්වා 2024 වර්ෂයේ දී ආරම්භ කිරීමෙන් දෙරටෙහි සහයෝගීතාවය වර්ධනය වීම ප්‍රත්‍යන්ත පාලන පද්ධතියේ සුවිශේෂී ජයග්‍රහණයකි. තවද කොළඹ වරාය නගර පරිශ්‍රය තුළ ආගමන හා විගමන කටයුතු සඳහා අවශ්‍ය සැලසුම් 2024 වර්ෂය තුළ ආරම්භ කර ඇත. මීට අමතරව මගී නිෂ්කාසන කටයුතු ක්‍රමවත් කිරීම උදෙසා ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම සමඟ සමීපව කටයුතු කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පරිශ්‍රයේ මගී නිෂ්කාසන කවුළු සඳහා ස්වයංක්‍රිය මගී නිෂ්කාසන දොරටු (e-gates) හඳුන්වා දීමේ ව්‍යාපෘතිය සඵල කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. මුහුදු තොටුපල සේවාවන් තවදුරටත් පුළුල් කරමින් මගී නිෂ්කාසන කටයුතු හා නාවුක කාර්ය මණ්ඩල සඳහා වන පහසුකම් වැඩිදියුණු කිරීම හා දියමත මගී නිෂ්කාසන ( on-board passenger Clearance) කටයුතු අඛණ්ඩව හා විධිමත්ව පවත්වා ගෙන යාම ද සිදු කර ඇත. එමෙන්ම ඉදිරියේ අන්තර් ජාතික පිළිගැනීමක් සහිත ගමන් බලපත්‍රයක් ලෙස ඉලෙක්ට්‍රොනික ගමන් බලපත්‍ර (e -passport) ලබා දීමට ප්‍රසම්පාදන කටයුතු 2024 වර්ෂයේ දී ආරම්භ කර ඇත.

2025 වසරට ප්‍රවිෂ්ඨ වී ඇති අපගේ දැක්ම, මෙහෙවර හා කාර්ය භාරයන් සපුරා ගැනීමට මඟ පෙන් වූ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා/අග්‍රාමාත්‍යතුමිය, අමාත්‍යාංශය භාර අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු සියලුම රජයේ ආයතන වලට ද, විදේශ දූත මණ්ඩලවල සේවයේ නිලධාරින්ට ද සියලුම ජාත්‍යන්තර සංවිධානවලට හා සියලුම සේවා ලාභීන්ට ද ස්තුතිය පුදකරනු ලබන අතර, විශේෂයෙන් අඛණ්ඩ සේවාවක් මහජනතාව වෙත ලබා දෙමින් රුපියල් බිලියන 38.01 ක ආදායමක් ජාතික ආදායමට රැස් කර දීමට ඇප කැප වී ක්‍රියා කළ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය ඇගයීමට ද මෙය අවස්ථාවක් කොට ගනිමි.

**අයි.චමින්ද පතිරාජ**
පාලක ජනරාල් (වැ.බ.)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
සුහුරුපාය
බත්තරමුල්ල

# - පටුන-

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ 1
1.1 හැඳින්වීම 1
1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු 2
1.3 ප්‍රධාන කාර්යයන් 2
1.4 සංවිධාන ව්‍යුහය 3
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන් 4
1.5.1 පාලන අංශය 5
1.5.1.1 පාලන ශාඛාව 5
1.5.1.2 පුහුණු හා සංවර්ධන ඒකකය 5
1.5.1.3 ප්‍රසම්පාදන ශාඛාව 6
1.5.1.4 ප්‍රවාහන ශාඛාව 6
1.5.1.5 සුබසාධන ඒකකය 6
1.5.1.6 මහජන තොරතුරු ඒකකය 7
1.5.1.7 පිළිගැනීමේ කවුළුව 7
1.5.1.8 පියස පරිශ්‍රය 7
1.5.2 ගමන් බලපත්‍ර අංශය 7
1.5.2.1 ගමන් බලපත්‍ර ශාඛාව 7
1.5.2.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව 8
1.5.2.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව 8
1.5.2.4 විදේශ දූත මණ්ඩල ශාඛාව 9
1.5.2.5 තැපැල් ශාඛාව 9
1.5.2.6 ප්‍රාදේශීය කාර්යාල 9
1.5.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය 9
1.5.3.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව 9
1.5.3.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව 10
1.5.3.3 නීති ශාඛාව 10
1.5.4 වීසා අංශය 11
1.5.5 විමර්ශන හා මෙහෙයුම් ශාඛාව 14
1.5.6 තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන අංශය 18
1.5.6.1 තොටුපළ ශාඛාව 19
1.5.7 පුරවැසි අංශය 20
1.5.8 ගිණුම් අංශය 20
1.5.9 අභ්‍යන්තර විගණන අංශය 21

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 24

2.1 2024 වර්ෂයේ දී අත්කරගත් ප්‍රගතිය 24

2.2 මෙහෙයුම් කාර්යයන් මගින් ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය 74

2.3 විශේෂ ජයග්‍රහණ 78

2.4 අභියෝග 79

2.5 ඉදිරි ඉලක්ක 79

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 81

04 පරිච්ඡේදය - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක 95

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 98

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 101

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 116

- ඇමුණුම්

ඇමුණුම් 01 - විගණකාධිපතිවරයාගේ වාර්තාව

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේ ද, 1956 ආගාමික හා විගාමික පනතට අදාලව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේ ද, පුරවැසිභාවය ප්‍රදානය කිරිමට අදාල පනත්වල විධිවිධානයන් යටතේ ද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

ජාතික ආරක්ෂාව තහවුරු වනසේ ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන් මෙරටට ඇතුළුවීම හා පිටවීම විධිමත්ව පාලනය කිරීම,මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශියන්හිදී තහවුරු කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවය මත විදේශ ගමන් බලපත් නිකුත් කිරීම,විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දරුවන් සඳහා සහ මෙරට පුරවැසිභාවය ඉල්ලුම් කරන තැනැත්තන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වේ. එමෙන්ම නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම හා සුහදශීලි සේවයක් සපයාදීමට කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් කැපවී ක්‍රියා කරයි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ජාතික අදායම් උත්පාදනය කිරීමෙහිලා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන දෙපාර්තමේන්තුවකි. එසේම එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වර්ෂය තුළදී රුපියල් බිලියන 38.01ක ආදායමක් ජාතික ආදායමට රැස් කර දීමට හැකියාව ලැබී තිබිණි.

**නෛතික අධිකාරිය**

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 18 දරන පුරවැසි පනත සහ ඊට අදාල සංශෝධන
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාල සංශෝධන
- 1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාල සංශෝධන
- 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත හා ඊට අදාල සංශෝධන
- 1988 අංක 39 දරණ ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසි භාවය ප්‍රදානය කිරීමේ පනත
- 2008 අංක 38 දරන චීන සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- ඉහත පනත්වලට අදාල සියලුම රෙගුලාසි හා නියෝග
- ආගමන විගමන පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

## 1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු

### දැක්ම

**කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම**

### මෙහෙවර

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම

**අරමුණු**

- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශ්වකරුවෙක් ලෙස කටයුතු කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නම් කරන ලද තොටුපළ හරහා නිත්‍යානුකූලව ඇතුළුවීම හා පිටවීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රාජ්‍ය සේවයේ විශිෂ්ඨතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළු වීම පාලනය කිරීම පිටවීම විධිමත් කිරීම, මෙරට රැඳී සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් නොවන තැනැත්තන්ගේ කටයුතු අධීක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත් කිරීම.
- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත් කිරීම
- විදේශිකයින් සඳහා වීසා බලපත් නිකුත් කිරීම හා දීර්ඝ කිරීම.
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශාංගික කාර්යය.
- ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශාංගික කාර්යය.

## 1.4 සංවිධාන ව්‍යුහය



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන්

### 01. පාලන අංශය

- පාලන ශාඛාව
- පුහුණු හා සංවර්ධන ශාඛාව
- ප්‍රසම්පාදන ශාඛාව
- ප්‍රවාහන ශාඛාව
- සුබසාධන ඒකකය
- මහජන තොරතුරු ඒකකය
- පිළිගැනීමේ කවුළුව
- පියස පරිශ්‍රය

### 02. ගමන් බලපත් අංශය

- ගමන් බලපත්‍ර ශාඛාව
- ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව
- ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
- විදේශ දූත මණ්ඩල ශාඛාව
- තැපැල් ශාඛාව
- ප්‍රාදේශීය කාර්යාල

### 03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

- ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව
- ඉන්දු ලංකා පුරවැසි ශාඛාව
- නීති ශාඛාව

### 04. වීසා අංශය

- වීසා ශාඛාව

### 05. තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන අංශය

- තොටුපළ ශාඛාව

### 06. විමර්ශන හා මෙහෙයුම් ශාඛාව

### 07. ගිණුම් අංශය

### 08. අභ්‍යන්තර විගණන අංශය

### 09. පුරවැසි අංශය

## 1.5.1 පාලන අංශය

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය, මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, වාහන භාවිතය කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු හා සංවර්ධන කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු, දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාල හා අනෙකුත් කාර්යයන් සඳහා වූ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මෙම අංශයේ කාර්යයන් වේ. එසේම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සහ බාහිර අංශ අතර මනා සම්බන්ධීකරණය හා කළමනාකරණය සිදු කිරීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ. එම කාර්යයන් පහත සඳහන් ශාඛාවන් සහ ඒකකයන් යටතේ ක්‍රියාත්මක වේ. මෙම සියලු කටයුතු පාලක (පාලන) ගේ අධීක්ෂණය අනුව සිදුවේ.

1. පාලන ශාඛාව
2. පුහුණු හා සංවර්ධන ශාඛාව
3. ප්‍රසම්පාදන ශාඛාව
4. ප්‍රවාහන ශාඛාව
5. සුබසාධන ඒකකය
6. මහජන තොරතුරු ඒකකය
7. පිළිගැනීමේ කවුළුව
8. පියස පරිශ්‍රය

### 1.5.1.1 පාලන ශාඛාව

මෙම ශාඛාව මඟින් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සිදු කරනු ලැබේ. එමෙන්ම මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය ,මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

### 1.5.1.2 පුහුණු හා සංවර්ධන ඒකකය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන සමස්ථ කාර්යය වපසරිය තුල අතීත අත්දැකීම්, නිර්මාණාත්මක භාවිතාවන්, ආචාරධර්ම පද්ධතීන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාධනීය තත්වයන් හා වර්තමාන සමාජීය, ආර්ථික, දේශපාලනික, නෛතික හා තාක්ෂණික ප්‍රසාරණයන්ට සරිලන ආකාරයෙන් ගලපා ගනිමින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්තව්‍ය වේ.

තවද, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඇතිවිය හැකි නව්‍ය හා පුළුල් විපර්යාසයන්ට හා ඒ මඟින් ඇති විය හැකි වෘත්තීය පීඩනය හා අභියෝගයන්ට ගලපා ගත හැකිවන සේ තත්කාල කාර්යය මණ්ඩලය හා කාර්යය පරාසය පුළුල් වීමට සාපේක්ෂව අළුතින් එක්වනු ලබන නව මානව සම්බන්ධතා පවත්නා හා ලඟාකරගත හැකි අවස්ථාවන් නිසි ලෙස කළමනාකරණය කරගනිමින්, මානව සම්පත් සංවර්ධන හා කාර්යය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම පුහුණු හා සංවර්ධන ඒකකයේ යටතට ගැනේ.

ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය මෙන්ම දේශීය හා විදේශීය සම්බන්ධිත ආයතනවල සහයෝගය ලබාගනිමින් සඵලදායි, අභිප්‍රේරිත, කාර්යය සාධන කණ්ඩායමක් ගොඩනැංවීම සඳහා වඩා සුදුසු කාලෝචිත, පුහුණු හා සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ප්‍රතිඵල ඇගයීම ද මෙම ඒකකයේ පුළුල් අරමුණු අතර වේ.

විවිධ සීමාකාරීන් හා උද්ගත වූ හදිසි හා අනපේක්ෂිත පාරිසරික වටපිටාවක පුහුණු හා සංවර්ධන ඒකකයේ 2024 වසර තුල ඉටුකරන ලද කාර්යභාරය පහත වගුවෙන් සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

ක්‍රියාත්මක කළ පුහුණු හා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව - 53

එමඟින්, පුහුණු හා සංවර්ධන ඒකකයේ 2024 වසර තුල ඉටුකරන ලද කාර්යයභාරය පිළිබඳ තොරතුරු 6 පරිච්ඡේදයෙහි 6.3 වගුවෙන් සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

### 1.5.1.3 ප්‍රසම්පාදන ශාඛාව

**කාර්යභාරය - 2024**

දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන් හි ඉල්ලීම පරිදි හා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව නියමිත කාලයක් තුළ දෙපාර්තමේන්තුවට අවශ්‍ය වැඩ, භාණ්ඩ හා සේවා ගුණාත්මක භාවයකින් යුක්තව (රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගතව) ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම මෙම අංශයේ කාර්යභාරය ලෙස සැකෙවින් දැක්විය හැකිය.

මෙම අංශය මඟින් ඉටුකරනු ලබන කාර්යයන්

- සෑම වර්ෂයක් ආරම්භයේ දීම අනුමත ක්‍රියාත්මක සැලැස්ම අනුව එම වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- එම ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිළ දී ගතයුතු භාණ්ඩ, සේවාවන් හා වැඩ ප්‍රසම්පාදනය කිරීමට අදාළ කටයුතු සිදුකිරීම.
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට අදාලව ප්‍රසම්පාදනය කලයුතු භාණ්ඩ, වැඩ හා සේවාවන් පිළිබඳ විස්තර ලබාදීම.
- කාර්තු/වාර්ෂික ප්‍රගති වාර්තා සැකසීම.
- 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතට අදාල කටයුතු සහ සැපයුම්කරුවන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය යන ප්‍රධාන භූමිකාවන් ඉටු කිරීම.

### 1.5.1.4 ප්‍රවාහන ශාඛාව

මෙම ශාඛාව මගින් ප්‍රධාන කාර්යාලයේ හා දිවයින පුරා පිහිටා ඇති වරාය ගුවන් තොටුපල, ප්‍රාදේශීය කාර්යාල සහ දේශ සීමා උල්ලංඝණය කර මෙරට රැඳී සිටින විදේශිකයන් අත්අඩංගුවට ගැනීම වැනි කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් හා දිවයින පුරා පිහිටි උසාවි සඳහා නිලධාරී ප්‍රවාහනය කිරීම, රාත්‍රි වැඩ මුරය අවසන් වූ මාණ්ඩලික නිලධාරීන් හා සෙසු නිලධාරීන් නිවෙස් කරා ප්‍රවාහනය කිරීම සිදු කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව සතු මුළු වාහන සංඛ්‍යාව 34 කි.

### 1.5.1.5 සුබසාධන ඒකකය

1060 පමණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකත්වයකින් යුත් ආගමන හා විගමන සුබ සාධක සංගමය, සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහ පොදුවේ මුළු මහත් සමාජයේ සුබ සිද්ධිය උදෙසා ආගමන හා විගමන සුබ සාධක සංගමය , සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහ පොදුවේ මුළු මහත් සමාජයේ සුභ සිද්ධිය උදෙසා ආගමික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුලින් කායික හා මානසික වශයෙන් නිරෝගීමත් සේවක පිරිසක් බිහිකරමින්, ඔවුන්ගේ කාර්යක්ෂම හා තෘප්තිමත් සේවාව තුලින් මහජනතාවට වඩාත් ගුණාත්මක සේවයක් ලබාදීම අරමුණයි.

### 1.5.1.6 මහජන තොරතුරු ඒකකය

1962 දුරකතන අංකය යටතේ මහජන තොරතුරු ඒකකය දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පස්වන මහලේ ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමට අවශ්‍ය සේවාවන් පිළිබඳ සියළු තොරතුරු මෙමගින් ලබා ගත හැක.

### 1.5.1.7 පිළිගැනීමේ කවුළුව

දෙපාර්තමේන්තුව වෙතින් සේවා අපේක්ෂිත මහජනයා පැමිණි විගස සුහදශිලී අයුරින් පිළිගැනීම සහ නිවැරදි අංශ වෙත යොමු කිරීම සිදුකරනු ලබයි.

### 1.5.1.8 පියස පරිශ්‍රය

දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන මහජනතාවට අවශ්‍ය උපදෙස් ලබාදීම, අයදුම්පත් භාරදෙන අවස්ථාව දක්වා රැදී සිටීම සහ එක් දින සේවාව යටතේ ගමන් බලපත්‍රය නිකුත් කරනතෙක් රැදී සිටීම සඳහා පියස පරිශ්‍රය ස්ථාපිත කර ඇත.මෙයට අමතරව මෙහිදී ගමන් බලපත්‍ර, වීසා සඳහා අවශ්‍ය ඡායාරූප ලබාගැනීමට අවස්ථාව ද අයදුම්පත් පිරවීමට අවශ්‍ය සහායක සේවා ද සලසා ඇති අතර ආපන ශාලා,සන්නිවේදන පහසුකම් සපයා ගැනීමට හැකියාව ඇත.

## 1.5.2 ගමන් බලපත්‍ර අංශය

පාලක(ගමන් බලපත්)ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මහජනතාව සමඟ වඩාත් සමීපතම අංශය වේ. ශ්‍රී ලාංකිකයින්ට විදේශ රටවලට බාධාවකින් තොරව ගමන් කිරීමට, නැවතී සිටීමට හා ආපසු ඒමට භාවිතා කළ හැකි වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලබයි. ගමන් බලපත්‍ර නිකුත් කිරීම එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යටතේ සිදු කරනු ලබන අතර, මෙම සේවාවන් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කරනු ලබයි.

**අරමුණු හා කාර්ය භාරය**

1. නිවැරිදි ගුණාත්මක හා සත්‍ය තොරතුරු ඇතුළත් විදේශ ගමන් බලපත්‍ර ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයන් අනුගමනය කිරීම
2. ශ්‍රී ලාංකීය ගමන් බලපත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට හා වැඩි දියුණු කිරීමට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම
3. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු සම්බන්ධයෙන් අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම
4. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු වලට අදාළව රාජ්‍ය ආරක්ෂක අංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කිරීම

මෙම අංශයේ කාර්යභාරය පහත සඳහන් ශාඛාවන් 5ක් හා ප්‍රාදේශීය කාර්යාල 4ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

- ගමන් බලපත්‍ර ශාඛාව
- ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව
- ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
- විදේශ දූත මණ්ඩල ශාඛාව
- තැපැල් ශාඛාව
- ප්‍රාදේශීය කාර්යාල - මහනුවර, වව්නියාව, කුරුණෑගල, මාතර

### 1.5.2.1 ගමන් බලපත්‍ර ශාඛාව

දෛනිකව වැඩිම සේවාලාභීන් සංඛ්‍යාවක් පැමිණෙන ශාඛාව ගමන් බලපත්‍ර ශාඛාවයි. ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය වශයෙන් ගමන් බලපත් ලබා ගැනීම සඳහා මහනුවර, මාතර, වව්නියාව හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 4ක් පිහිටුවා ඇත. මෙම කාර්යාලවලින් එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යන ක්‍රම දෙකටම ගමන් බලපත් නිකුත් කරනු ලබයි.

### 1.5.2.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව

පාලක (ගමන් බලපත්‍ර)ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.
ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමු වන අයදුම්පත්‍ර අදාල පරීක්ෂා කිරීම් වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි.

දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝඛණය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍ර වල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා ගමන් බලපත්‍රයේ 04 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, සැසඳීම හා 04 වන පිටුව පරිලෝකනය කිරීම (Compare & 04th Page Scan) සහ තත්ත්ව පරීක්ෂාව (Quality Confirm) සිදු කර ඉන් අනතුරුව අවසාන වශයෙන් අධීක්ෂණ මට්ටමේ තත්ත්ව පරීක්ෂාව (Supervisor Quality Confirm) සිදු කර එහි මුද්‍රිත වාර්ථාවද සමග එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් නිකුත් කිරීමේ කවුළු වෙතත්, සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් ශාඛාව වෙතටත්, විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන අයදුම්පත් වෙනුවෙන් නිකුත් කරන ගමන් බලපත් විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.

මීට අමතර ව සංශෝධන කටයුතු සඳහා යොමු කෙරෙන අයදුම්පත්‍ර අදාල පරීක්ෂා කිරීම් වලින් අනතුරුව දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 04 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) ද සිදු කරනු ලබයි.

මෙම ක්‍රමවේදයට අමතරව අළුතින් ආරම්භ කරන ලද මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම් කරන ලද ගමන් බලපත් මුද්‍රණ ක්‍රියාවලියේ දී අයදුම්පත් පරීක්ෂා කිරීම, ඊට අදාල බාර් කෝඩ් සහිත අංක මුද්‍රණය කිරීම, ගමන් බලපත් මුද්‍රණය කිරීම ඇතුළු පසු අදියරයන් සියල්ලම සිදු කරනු ලබයි.

### 1.5.2.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

පාලක (ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ. නිකුත් කරන ලද ගමන් බලපත්‍රයට අදාලව ගමන් බලපත්‍රලාභීන් විසින් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා විවිධ කාණ්ඩ යටතේ ගමන් බලපත්‍රයට සංශෝධනයන් ඇතුළත් කිරීම මෙම ශාඛාව මගින් සිදු කරනු ලබයි.

එක් සංශෝධනයක් සඳහා රු. 1200/= ක මුදලක් අය කරනු ලබන අතර, සරප් අංශ නිලධාරියකුගේ සහ පරිගණක අංශ නිලධාරීන් තිදෙනෙකුගේ ද සහය ඇතිව පැයක කාලයක් ඇතුළත සංශෝධිත ගමන් බලපත්‍රය සේවාලාභීන් වෙත ලබා දෙනු ලැබේ.

මෙම ශාඛාවේ කාර්යභාරය පහත පරිදි වේ.

- වාසගම/ වෙනත් නම් සංශෝධනය
- විවාහයට පෙර නම ඇතුළත් කිරීම
- විවාහයට පසු නම ඇතුළත් කිරීම
- තනතුර සටහන් කිරීම/ තනතුර ඉවත් කිරීම
- ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කිරීම
- එක් විදේශ ගමනකට වලංගු කිරීම
- තනි ගමන් සීමාව අවලංගු කිරීම
- උපන් ස්ථානය සංශෝධනය කිරීම
- ද්විත්ව පුරවැසිභාවය ඇතුළත් කිරීම
- වලංගු කාලසීමාව සඳහා පනවා ඇති කොන්දේසි ඉවත් කිරීම

#### 1.5.2.4 විදේශ දූත මණ්ඩල ශාඛාව

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. විදේශ දූත මණ්ඩල මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙන අයදුම්පත් සඳහා සකස් කළ නව විදෙස් ගමන් බලපත් නැවත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත යොමු කරන අතර විදේශ දූත මණ්ඩල මඟින් අදාළ අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සිදු කරයි.

**විදේශ දූත මණ්ඩල ශාඛාවේ අරමුණු හා කාර්යභාරය**

- විදේශ දූත මණ්ඩල වලින් ලැබෙන අයදුම්පත් වලට අදාළ ගමන් බලපත් නිකුත් කිරීම
- විදේශගත ශ්‍රී ලාංකිකයන් හට විදේශ දූත මණ්ඩල වලින් තාවකාලික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදීම
- විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ විදෙස් ගමන් බලපත්වල තොරතුරු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම
- විදේශ දූත මණ්ඩල විසින් ඉල්ලා ඇති අවස්ථාවල විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත් වලට අදාළ නිරවද්‍යතාවය තහවුරු කිරීම සහ විදේශ දූත මණ්ඩල ඉල්ලා සිටින අවස්ථාවන්හි ගමන් බලපත් පිළිබඳ උපදෙස් ලබා දීම
- අරාබි භාෂාවට පරිවර්තනය කිරීමෙන් පසු සහතික කිරීම
- අයිතිකරුවන් සොයාගත නොහැකිව ආපසු ලැබෙන විදෙස් ගමන් බලපත් පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කිරීම හා එම පද්ධතිය කළමනාකරණය කිරීම.

#### 1.5.2.5 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ සකස් කරනු ලබන ගමන් බලපත් ප්‍රමාදයකින් තොරව අයදුම්කරුවන්ට ලියාපදිංචි තැපැල් මගින් යැවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

#### 1.5.2.6 ප්‍රාදේශීය කාර්යාල

මාතර, මහනුවර, වවුනියාව හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල පිහිටා ඇති අතර සාමාන්‍ය සේවය හා එක්දින සේවය යටතේ ගමන් බලපත් නිකුත් කිරීම හා ගමන් බලපත්‍ර වල සංශෝධන කටයුතු එමගින් සිදු කරනු ලබයි.

### 1.5.3 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

මෙම අංශය යටතේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව, ඉන්දු ලංකා පුරවැසි ශාඛාව හා නීති ශාඛාව යන ශාඛාවන් ක්‍රියාත්මක වන අතර අධීක්ෂණය පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) මඟිනි.

#### 1.5.3.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වඩාත් සැලසුම් සහගතව හා වඩා විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ශාඛාව ස්ථාපිත කර ඇත.

**ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යන්**

1. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටුකිරීමේදී අදාල වන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම.
2. දෙපාර්තමේන්තුවට අදාල නීති, අණ පනත් සංශෝධනය.
3. අභ්‍යන්තර චක්‍රලේඛ හා කාර්ය පටිපාටි සකස් කිරීම හා නිකුත් කිරීම, මෙහෙයුම් අත්පොත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
4. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරීම හා එය ක්‍රියාවට නැගීමට අදාල කටයුතු කිරීම.

5. පසුගිය වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
6. අනෙකුත් ආයතන වලට මාසිකව, කාර්තු වශයෙන් හා වාර්ෂිකව යැවිය යුතු ප්‍රගති වාර්තා සකස් කිරීම හා නියමිත දිනට එම වාර්තා අදාල ආයතන වෙත යොමු කිරීම.
7. රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමඟ ප්‍රතිපත්තිමය කටයුතු වලට අදාල රාජකාරි සම්බන්ධීකරණය කිරීම.
8. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා වෙනත් අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම.
9. පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම.
10. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත ව්‍යාපෘති සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම හා වාර්ෂිකව සිදු කරන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය සමාලෝචනය කිරීම, සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

**2024 වර්ෂයේ විශේෂ කාර්යයන්**

- ප්‍රාග්ධන ව්‍යාපෘතීන් 61%ක ප්‍රගතියකින් අවසන් කිරීමට අවශ්‍ය මෙහෙයුම් කටයුතු සිදුකිරීම.
- මෙම දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන ඉන්දු ලංකා පුරවැසි අංශයට අදාල පුරවැසි සහතිකවල තොරතුරු ඇතුලත් ලේඛන පර්යාවලෝකනය කර විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කිරීම.

### 1.5.3.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) කටයුතු කරයි.

1949 අංක 03 දරන ඉන්දියානු හා පාකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත,1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත, 1988 අංක 39 දරන ආදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යන පනත්වල සඳහන් ආකාරයට සුදුසුකම් සපුරන තැනැත්තන්ට එම පනත් ක්‍රියාත්මක වූ දිනයේ සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි වී ඇත. ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් වෙත පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුශංගික කාර්යයන් ඉටු කිරීම හා මෙයට අමතරව චීන සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමට අදාල 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත අනුව ඊට ආනුශංගික කාර්යන් ඉටු කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

### 1.5.3.3 නීති ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නීති අංශය මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යානුබද්ධ අණපනත් මගින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීමටත්, අවශ්‍යතාවයන් අනුව අදාළ අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කිරීම මඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට සහාය වීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ.

**නීති අංශයෙන් ඉටුකරන ලද කාර්යයන්:**

I. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකු වගඋත්තරකරුවෙකු ලෙස සඳහන් කරන නඩුවලට අදාලව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

II. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට අධිකරණය ඉදිරියේ සාක්ෂි දීම පිණිස සිතාසි යොමු කර ඇති අවස්ථාවන්හි දී අදාළ තොරතුරු සහ ලිපිගොනු සකස් කර සුදුසු නිලධාරින් අදාළ දිනයන්හි දී අධිකරණයේ පෙනී සිටීම හා සාක්ෂි ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

III. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකි තොරතුරු අසම්පූර්ණ අධිකරණ නියෝග සම්බන්ධ දැනුවත් කිරීමේ ලිපි සහ අධිකරණයට යොමු කරන තොරතුරු වාර්තා සකස් කර අදාළ අධිකරණ රෙජිස්ටාර්වරුන් වෙත යොමු කිරීම.

**ගිවිසුම් හා සම්බන්ධ කටයුතු**

I. රාජ්‍යතාන්ත්‍රික හා රාජකාරි ගමන් බලපත් දරන්නන් සඳහා ද්විපාර්ශ්වික වීසා නිදහස් කිරීමේ ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සිදුකිරීමට කටයුතු කිරීම.

II. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාළ වන්නාවූ කාර්යයන් සම්බන්ධ දේශීය ආයතන සමඟ දෙපාර්තෙමේන්තුව එළඹ ඇති ගිවිසුම් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා ඊට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

III. නැවත ප්‍රවේශ කර ගැනීමේ ගිවිසුම් (re-admission) සකස් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම හා විදේශ අමාත්‍යාංශය සමඟ එක්ව අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

IV. දෙපාර්තෙමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නාවූ ගොඩනැගිලි, නිවාස සම්බන්ධව අදාළ පාර්ශව අතර ඇති කරගන්නා බදු ගිවිසුම් සැකසීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

V. මෙම දෙපාර්තෙමේන්තුව වෙනත් රාජ්‍ය ආයතන සමඟ එළඹෙන ගිවිසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දීම, නීතිපති දෙපාර්තමේන්තු නිර්දේශ ලබා ගැනීම.

### 1.5.4 වීසා අංශය

පාලක (වීසා)ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. විදේශීය ජාතිකයින්ගේ ගමන් බලපත්‍රවල වීසා කටයුතුවලට අදාළ ක්‍රියාවන් මෙම අංශයෙන් සිදු වේ.

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතේ III කොටසෙහි, ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කිරීමට අදාළ විධිවිධාන අනුව පනතට අදාළ ව සම්පාදනය වූ 1956 ආගමන හා විගමන රෙගුලාසීන් හි අංක 02 සිට අංක 35 ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූල ව රැඳී සිටීමට වලංගු වීසා බලපත් නිකුත් කිරීම හා වීසා කාලය දීර්ඝ කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ.

රට තුලට පැමිණෙන විදේශිකයන්ට වීසා නිකුත් කිරීම හා දිර්ඝ කිරීම තුළින් රටේ ජාතික ආදායමට සුවිශේෂ දායකත්වයක් ලබා දීම, අත්‍යවශ්‍ය සේවයන් සඳහා සේවා නියුතු විදේශිකයන්ට පහසුකම් සැලසීම මගින් ජාතික සංවර්ධනයට දායක වීම, රටට හිතකර ආකාරයට වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

ඉහත ආගාමික හා විගාමික පනත සහ එහි රෙගුලාසිවලට අනුකූලව මෙරටට පැමිණෙන විදේශිකයන් සඳහා නේවාසික/ වාස වීසා හා නේවාසික නොවන වීසා යනුවෙන් ප්‍රධාන වීසා කාණ්ඩ දෙකක් යටතේ මෙම දෙපාර්තමේන්තුව මගින් වීසා නිකුත් කෙරේ.

## නේවාසික / වාස වීසා (Residence Visa)

විශේෂිත අරමුණු සඳහා ශ්‍රී ලංකාව තුළ දීර්ඝ කාලීන ව වාසය කිරීමට අපේක්ෂා කරන පහත සඳහන් කාණ්ඩවලට අයත් ශ්‍රී ලාංකිකයන් නොවන පුද්ගලයින් හට මෙම වීසාවන් නිකුත් කෙරේ.

01. සේවා නියුක්තිකයන්
    - ආයෝජන මණ්ඩලය යටතේ ව්‍යාපෘතිවල සේවයේ නියුතු වූවන්
        - රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන්
        - පෞද්ගලික සමාගම් /රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල සේවකයන්

02. ආයෝජනය කරන්නන්
    - ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රාග්ධනය ආයෝජනය කරන්නන්
    - ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතුවල නියුක්තවන්නන්

03. ආගමික කාර්යයන් සඳහා පැමිණෙන්නන්
    - පූජ්‍ය පක්ෂය
    - ආගමික ස්ථාන ඉදිකරන්නන්/ ආවතේවකරුවන්

04. ශිෂ්‍යයන්
    - විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්
    - රජයේ අනුමත අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන්

05. 1967 ඉන්දු ලංකා ගිවිසුමෙන් ආවරණය වන ලියාපදිංචි ඉන්දියානුවන්

06. හිටපු ශ්‍රී ලාංකිකයන් හා ඔවුන්ගේ යැපෙන්නන්

07. ශ්‍රී ලාංකිකයකුගේ පවුලේ සාමාජිකයින්
    - විදේශීය කලත්‍රයා
    - විදේශිකත්වය හිමි ළමයින්

08. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩලවල සේවයේ යෙදී සිටින්නන් හා යැපෙන්නන්
09. මගේ සිහින නිවහන (My Dream Home) - දීර්ඝ කිරීම් පමණි.
10. ආගන්තුක (RGS) - දීර්ඝ කිරීම් පමණි.
11. වෛද්‍ය හේතුන් මත රැඳී සිටින්නන්
12. රන් පාරාදීසය වීසා වැඩසටහන (Golden Paradise Visa Program )
13. කොළඹ වරාය නගරය (Colombo Port City)
14. අධිකරණයේ පෙනී සිටීම සඳහා ලබාදෙන (Court)

## නේවාසික නොවන වීසා (Non -Residence Visa)

කෙටි කාලීන අවශ්‍යතාවයන් සඳහා මෙරටට පැමිණීම සඳහා නිකුත් කරනු ලබන වීසා වර්ගයයි. එය පැමිණීම හා මාර්ගස්ථ වශයෙන් වන අතර පැමිණීමේ වීසා, සංචාරක කටයුතු හා ව්‍යාපාරික කටයුතු වශයෙන් දෙයාකාර වේ.

## පැමිණීමේ වීසා (Visit Visa)

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් හා විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) යටතේ සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කෙටි කාලීනව විදේශිකයන් වෙත මෙම වීසා නිකුත් කරනු ලැබේ.

1. **සංචාරක කාර්යය සඳහා වීසා**

පහත කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට කෙටි කාලීන ව පැමිණෙන විදේශිකයන් වෙනුවෙන් විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ දින 30 ක කාලයක් සඳහා මෙම වීසා නිකුත් කෙරේ.

- MICE – සංචාරක කටයුතු - අයෝජක සම්මන්ත්‍රණ/ ප්‍රදර්ශන/ වැඩසටහන්/ ජම්බෝරිය (TOURISM - Investors Conference/ Exhibitions/ Events/ Jamboree)
- ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම - හර්බල් (Medical Treatment Including Ayurvedic (Herbal)
- කලා, සංගීත හා නර්තන වැඩසටහන් සඳහා සහභාගී වීම (Participant in art Music and dance Event)
- වන්දනා/ ක්‍රීඩා වැඩසටහන්/ විවාහ මංගල උත්සවවලට සහභාගිවීම (Participant in Pilgrimages/ Sport Event/ Weddings)
- සංචාර හෝ නිවාඩුගත කිරීම සඳහා (Sightseeing or Holidaying)
- හිතමිතුරන් හා ඥාතීන් බැලීම සඳහා (Visiting Friends and Relatives)

2. **කෙටි කාලීන ව්‍යාපාරික කටයුතු සඳහා වන (Business Visa)**

සංචාරක නොවන කෙටි කාලීන ව්‍යාපාරික ස්වරූපයේ අනෙකුත් කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට මෙම වීසා නිකුත් කරනු ලැබේ. මේ සඳහා අදාළ කාර්යය තහවුරු කෙරෙන ලේඛණ ඉදිරිපත් කළ යුතුය. (උදා: ව්‍යාපාරික සාකච්ඡා/ ආයතනික වැඩමුළු) ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණෙන්නන්හට වසරක වීසා කාලයක් ලබා දේ.

3. **බහුවාර පිවිසුම් වීසා - ව්‍යාපාරික (Multiple Entry Visa Business)**

මෙම වීසා ද ව්‍යාපාරික කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට වසරක කාලයක් සඳහා ලබා දෙන අතර, මෙම වීසා ලබා ගැනීමෙන් පසු මෙරට රැඳී සිටිය හැකි කාලය උපරිම දින 180 කි.

## මාර්ගස්ථ වීසා (Transit Visa)

ශ්‍රී ලංකාවෙන් බැහැර ව වෙනත් රටක සිට තවත් රටක ගමනාන්තයක් කරා යන අතරතුර දී ශ්‍රී ලංකාවට ඇතුළුවීම සඳහා නිකුත් කරනු ලබන වීසාවකි. මෙය දින 2 ක උපරිමයකට යටත් ව නොමිලයේ නිකුත් කරනු ලැබේ.

**මාර්ගස්ථ වීසා**

- ශ්‍රී ලංකාව හරහා වෙනත් ගමනාන්තයක් කරා යන මගියෙකුට දින දෙකක් ගාස්තු ගෙවීමකින් තොරව මාර්ගස්ථ වීසාවක් ලබාදේ.
- ශ්‍රී ලංකාවේ වරායක් හරහා මගී යාත්‍රාවකින් යන සංචාරකයන්ට මෙරට තුළ දින 04 ක් සංචාරය කිරීමට මාර්ගස්ථ වීසාවක් ලබා දීමට ඇමරිකානු ඩොලර් 25 ක ගාස්තුවක් අය කෙරේ.
- ශ්‍රී ලංකාවෙහි ජල තීරයෙහි ඇති නැවක වෙළඳ නාවික පිරිසේ සාමාජිකයින් දින 30 කාලයක් ගොඩබිමට පැමිණීම සඳහා ගාස්තු අය කිරීමකින් තොරව වෙරළ අවසර පත්‍රයක් ලබාදේ. ඔවුන් තව දුරටත් රැඳී සිටින්නේ නම් ඉදිරි මාස 02 ක් සඳහා මාසික ගාස්තුව ඇමරිකානු ඩොලර් 25 ක් ගෙවීමෙන් වීසා දීර්ඝ කර ගත හැක. පැමිණි දින සිට මාස 03 කට වඩා වැඩි කාලයක් රැඳී සිටින්නේ නම් අදාළ ගාස්තු ගෙවා වීසා අයදුම් කළ යුතුය.

ඉහත සඳහන් වීසා ලබාදීම් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සලකා බලා ගනු ලබන තීරණයන්ට අනුව වීසා නිකුත් කිරීමේ දැනට පවතින ක්‍රමවේදයම අනුගමනය කිරීම සහ ඒ අනුව ආරක්ෂක නිශ්කාෂන වාර්තා ලබා ගැනීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි නේවාසික වීසා සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සැලැස්ම ලබා ගැනීම තවදුරටත් ඒ අයුරින්ම ක්‍රියාත්මක වේ.

**ස්ථිර වාස වීසා**

ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කිරීමට හැකියාවක් නොමැති ශ්‍රී ලාංකික පුරවැසිභාවය හිමිව තිබූ පුද්ගලයන් සඳහාද, ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ විදේශිය කලත්‍රයාට හා විදේශීය දරුවන්ට ස්ථිර වාස වීසාවක් නිකුත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කර ඇති අතර, ඉහත ක්‍රමවේදය අනුව වීසා ලබා දීම ඉක්මනින් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

### 1.5.5 විමර්ශන හා මෙහෙයුම් ශාඛාව

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත හා ඒ යටතේ පනවන ලද 1956 රෙගුලාසි සහ ජාත්‍යන්තර සම්මුතීන්වලට අනුකූල නොවන හා රටෙහි ආරක්ෂාවට තර්ජනයක් වන විදේශිකයන්, ශ්‍රී ලංකාවට ඇතුළුවීමට පෙර, ඇතුළුවන විට හා එහි රැඳී සිටින විට, හඳුනාගැනීම, ලංකාව තුළ දී ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝණය කරමින් රැඳී සිටින අයවලුන් අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු මෙහෙයවීම, ඉහත වැරදි වැළැක්වීමට සක්‍රීය ප්‍රවේශයකින් කටයුතු කිරීම, ඒ හා සම්බන්ධ නීතිය බලාත්මක කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලැබේ.

මෙම ශාඛාව අංශ 5ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

1. විමර්ශන ඒකකය (INVESTIGATION UNIT)
2. රඳවා තැබීමේ මධ්‍යස්ථාන (DETENTION CENTERS)
3. තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික මධ්‍යස්ථානය (NAHTRC- NATIONAL ANTI HUMAN TRAFFICKING RESOURCE CENTER)
4. අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RISK ASSESSMENT CENTER)
5. දේශසීමා ආවේක්ෂණ ඒකකය (BORDER SURVEILLANCE UNIT)

**1. විමර්ශන ඒකකය**

ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරට රැඳී සිටින විදේශකයින් අත්අඩංගුවට ගැනීම, රඳවා තබාගැනීම හා රටින් ඉවත් කිරීම හා ඒ සම්බන්ධ විමර්ශන කාර්යයට අදාළ වෙනත් කටයුතු මෙම ඒකකය මගින් සිදු කරයි. එම විමර්ශනයන්, ආකාර දෙකකට සිදුකරනු ලැබේ.

I. ක්ෂේත්‍ර අවේක්ෂණය
II. දුරස්ථ ආවේක්ෂණය

**I. ක්ෂේත්‍ර අවේක්ෂණය**

ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ තොරතුරු හා පැමිණිලි මත අදාළ ස්ථානවලට ගොස් ස්ථානීය පරීක්ෂණයන් සිදු කරන අතර, විදේශිකයන්ගේ ගමන් බලපත්‍ර පරීක්ෂා කොට අවශ්‍ය ඉදිරි පියවරයන් සඳහා කටයුතු කරයි. මෙම වසරේ දී ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ සිදු කළ සමස්ථ විමර්ශනයන් සංඛ්‍යාව 1305ක් වූ අතර, ඉන් විමර්ශනයන් 942ක් ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.

### II. දූරස්ථ ආවේක්ෂණය

ක්ෂේත්‍ර ආවේක්ෂණ හා විමර්ශන කටයුතුවලට අමතරව, දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය ඇසුරින් දූරස්ථ ආවේක්ෂණය හරහා ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින හා ලංකාවට පැමිණෙන විදේශිකයින්ගේ නිවැරදි තොරතුරු රැස්කිරීම, තොරතුරුවල නිවැරදිබව තහවුරු කිරීම සඳහා විමර්ශන අංශය මගින් 2019 වර්ෂයේ සිට දූරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාවලිය හරහා සැක සහිත විදේශිකයන්ගේ තොරතුරු විපරම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

දූරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලියේ කෙටිකාලීන අරමුණු;

1. අක්‍රමවත් සංක්‍රමණිකයන් හඳුනා ගැනීම.
2. අක්‍රමවත් සංක්‍රමණය සඳහා ආධාර අනුබල දෙන්නන් හඳුනා ගැනීම.
3. අක්‍රමවත් සංක්‍රමණය සඳහා ආධාර අනුබල දෙන්නන්ගේ තොරතුරු තහවුරු කරගැනීම.

දූරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලියේ දිර්ඝ කාලීන අරමුණු;

1. වීසා කාලය ඉක්මවා රැඳීසිටින්නන්ගේ සංඛ්‍යාව අවම කිරීම.
2. වීසා කොන්දේසි උල්ලංඝණනය වීම අවම කිරීම.
3. ශ්‍රී ලංකාව තුළ හා ශ්‍රී ලංකාව හරහා සිදුවන තැනැත්තන් වෙළඳාම හා මිනිස් ජාවාරම වැළැක්වීම.
4. ශ්‍රී ලංකාව තුළ හා ශ්‍රී ලංකාව හරහා සිදුවන තැනැත්තන් වෙළඳාමේ වින්දිතයන් හඳුනා ගැනීම.

- වීසා දීර්ඝ නොකිරීම නිසා තැනැත්තන් වෙළඳාමේ වින්දිතයන් වීමට විභවයක් ඇති, විශේෂයෙන් විදේශික කාන්තාවන් එයින් මුදා ගැනීමට හා එමඟින් ආගමන හා විගමන නීති හා වෙනත් නීති උල්ලංඝණය වීමට තිබූ හැකියාව තුරන් කිරීමට දූරස්ථ ආවේක්ෂණ ක්‍රියාවලිය හරහා හැකි වී ඇත.

## 2. රඳවා තැබීමේ මධ්‍යස්ථාන (DETENTION CENTERS)

ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටි විදේශිකයන් සහ ශ්‍රී ලංකාව තුළ විවිධ අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව, නීතිමය කටයුතු අවසන් වූ පසු මෙරටින් ඉවත් කිරීමට නියමිත විදේශිකයන් රඳවා තබා ගැනීම, ඉවත් කරන තෙක් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සැපයීම සහ අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම මෙම රැඳවුම් මධ්‍යස්ථාන මගින් සිදු කරයි.

ඒ අනුව, රැඳවියන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍යතා මතු වූ විට රාජකාරියේ නිරත නිලධාරීන් විසින් එම රැඳවියන් රෝහල් කරා රැගෙන යාම, රෝහල්ගත කිරීමට අවශ්‍ය අවස්ථාවල දී රෝහල්ගත කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී වෛද්‍ය කඳවුරු පැවැත්වීම මෙන්ම අධිකරණය වෙත ඉදිරිපත් කිරීම ද සිදු කරනු ලබයි.

දැනට මෙම දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය වන රැඳවුම් මධ්‍යස්ථාන දෙකකි.

I. මිරිහාන රඳවා තැබීමේ මධ්‍යස්ථානය
II. වැලිසර රඳවා තැබීමේ මධ්‍යස්ථානය

1) මෙම රඳවා තැබීමේ මධ්‍යස්ථානවල රඳවා තබන විදේශිකයන් වන්නේ;
2) විමර්ශන අංශය මගින් ආගාමික හා විගාමික පනත උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලබන විදේශිකයන්
3) අධිකරණ නියෝග මත රටින් පිටුවහල් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට භාර දෙන විදේශිකයන්

4) ආගාමික හා විගාමික පනත උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය මගින් අත්අඩංගුවට ගනු ලබන විදේශිකයන්
5) ආගාමික හා විගාමික පනත උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් දෙපාර්තමේන්තුව වෙත භාර වන විදේශිකයන් සිටින අතර, ඔවුන්ගෙන් පිරිමි 23ක්, කාන්තාවන් 24ක් හා ළමුන් 57ක් ද විය

### 3. තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (NAHTRC - NATIONAL ANTI HUMAN TRAFFICKING CENTER)

තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය යටතේ ක්‍රියාත්මක වන ඒකකයක් වන අතර, ඒ මඟින්, රට තුළ සිටින විදේශිකයන්ට සහ දේශසීමා හරහා සිදුවන තැනැත්තන් වෙළඳාමට සම්බන්ධ සිදුවීම් හඳුනාගෙන ඒවා වැළැක්වීම සඳහා විමර්ශන අංශයට සහය ලබා දීම, ආගමන හා විගමන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ඉහත සිදුවීම් විමර්ශනයට සම්බන්ධ වන අනෙකුත් ආයතන වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අධිකරණ අමාත්‍යාංශය සහ ජාතික වශයෙන් පිහිටුවා, ආරක්ෂක අමාත්‍යාංශය මගින් මෙහෙයවන, තැනැත්තන් වෙළඳාම වැළක්වීමේ කාර්ය සාධන බලකාය වෙත කරුණු යාවත්කාලීන කිරීම සහ අවශ්‍ය සහ-සම්බන්ධීකරණය පවත්වාගෙන යාම, ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව මගින් සකසන "තැනැත්තන් වෙළඳාම පිළිබඳ වාර්තාව" සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වාර්ෂිකව සිදු කල වැඩසටහන්වල තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය හරහා දැනුවත් කිරීම, ගුවන් තොටුපලෙහි ආගමන හා විගමන අංශය සහ විශේෂයෙන් දේශසීමා ආවේක්ෂණ ඒකකය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, විදේශ ආගමන හා විගමන නිලධාරීන් සමග බුද්ධි තොරතුරු හුවමාරුව, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමග තැනැත්තන් වෙළඳාම වැළැක්වීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මඟින් සිදු කෙරේ.

### 4. අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RISK ASSESSMENT CENTER)

- 2019 මැයි මස විමර්ශන අංශය යටතේ පිහිටුවන ලද මෙම මධ්‍යස්ථානය මඟින් ප්‍රත්‍යන්ත පාලන කටයුතුවලට අදාළ හා ඊට අනුශාංගික බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීම, සකස් කිරීම, සැලසුම් කිරීම හා විශ්ලේෂණය කිරීම තුළින් ශ්‍රී ලංකාවට ඇතුළු වීමට බලාපොරොත්තු වන, රටට ඇතුළු වන, රට තුළ රැඳී සිටින හා ශ්‍රී ලංකාවෙන් පිටවන අවදානම් සහගත මඟීන් හා ප්‍රවණතා කල්තියා හඳුනා ගැනීම සිදු කරනු ලබයි. එමඟින් ඔවුන් රටට පැමිණීම හෝ පිටවීම වළක්වාලීම සහ එකී තොරතුරු ආරක්ෂාවට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ හුවමාරු කරගැනීම අවදානම් තක්සේරු මධ්‍යස්ථානයේ කාර්යයන් වේ. ඒ අනුව, කෙටිකාලීන හා දීර්ඝ කාලීන ආගමන විගමන ආරක්ෂක හා විමර්ශන ක්‍රම උපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දත්ත ඉතා ඵලදායීව යොදාගනු ලැබේ.

- මෙම ඒකකය හරහා තැනැත්තන් වෙළඳාම්කරුවන්, වින්දිතයන්, තැනැත්තන් ජාවාරම්කරුවන්, නීති විරෝධී සංක්‍රමණිකයන්, සංවිධානාත්මක අපරාධකරුවන් විසින් නීති විරෝධී ක්‍රියාවන් සඳහා යොදා ගන්නා ගමන් මාර්ග හඳුනා ගැනීම සිදු කරනු ලබයි. එමෙන්ම, ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම්සහගත නව සංක්‍රමණ ප්‍රවණතා (Patterns) සම්බන්ධව නිරන්තර අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

- මඟියෙකු රටට ඇතුළු වීමට පෙර වීසා සම්බන්ධව විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබාගැනීමේ දී අවදානම් සහගත විදේශිකයන්ගේ වීසා අනුමත කිරීමට ප්‍රථමයෙන් ඔවුන් පිළිබඳ සොයා බැලීම මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි.

- වීසා කාලය ඉක්මවා මෙරට රැඳී සිටින විදේශීකයන්ගේ තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම හා අවශ්‍ය පරිදි අනෙකුත් දෙපාර්තමේන්තුවල සහය ලබා ගැනීම සහ විවිධ වීසා කාණ්ඩයන් යටතේ මෙරටට පැමිණෙන තැනැත්තන් හා ඔවුන් නැවතී සිටින ස්ථාන සම්බන්ධයෙන් තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම, හුවමාරු කරගැනීම හා තොරතුරු යාවත්කාලීන කිරීම ද මෙම ඒකකය මඟින් සිදු කරනු ලබයි.

- ඒ අනුව, අවදානම් තක්සේරු මධ්‍යස්ථානය විසින් විශ්ලේෂණය කරනු ලබන තොරතුරු අංශයේ අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය උදෙසා විමර්ශන ඒකකය හා දේශසීමා ආවේක්ෂණ ඒකකය සමඟ ද හුවමාරු කරගනු ලබයි.

## 5. දේශ සීමා ආවේක්ෂණ ඒකකය (BORDER SURVEILLANCE UNIT)

සංවිධානාත්මක අපරාධ ලෙස සැලකෙන මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරම අවම කිරීම සහ වීසා අවභාවිතාවන් පිළිබඳ විමර්ශනයන්ට අවශ්‍ය සහය ලබා දීමේ අරමුණු ඇතිව 2019 ජුලි මස සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ කේන්ද්‍ර කරගනිමින් දේශසීමා ආවේක්ෂණ ඒකකය ස්ථාපිත කර ඇත.

**දේශ සීමා ආවේක්ෂණ ඒකකයෙන් ඉටු කරන කාර්යයන්;**

- මෙම ඒකකය හරහා තැනැත්තන් වෙළඳාම්කරුවන් හා වින්දිතයන්, තැනැත්තන් ජාවාරම්කරුවන් හා සංචාරක වීසා අවභාවිතා කරන්නන්, ව්‍යාජ ගමන් බලපත්‍ර හා ව්‍යාජ ලියකියවිලි භාවිත කරන්නන් හඳුනා ගැනීම සිදු කරනු ලබයි. ඒ හරහා සොයාගනු ලබන බුද්ධි තොරතුරු විමර්ශන ඒකකය හා මිනිස් ජාවාරම් තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය වෙත සන්නිවේදනය කිරීම තුළින් තැනැත්තන් වෙළඳාම හෝ මිනිස් ජාවාරම් සහ වෙනත් සංවිධානාත්මක අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු මෙහෙයවනු ලබයි. එමෙන්ම, විමර්ශන ඒකකය හා අවදානම් තක්සේරු මධ්‍යස්ථානය විසින් සොයාගනු ලබන බුද්ධි තොරතුරු මෙම ඒකකයට සන්නිවේදනය කිරීම තුළින් අදාළ සැකකටයුතු ආගමන හා විගමන පිළිබඳ ගුවන් තොටුපලේ දී දැඩි සුපරීක්ෂාවට ලක් කෙරේ.

- 2024 වර්ෂය සඳහා, මෙම ඒකකය මඟින් ව්‍යාජ ලියකියවිලි 190ක් හඳුනා ගෙන ඇති අතර, අක්‍රමවත් සංක්‍රමණ 295ක් හඳුනා ගනිමින් එවැනි ක්‍රියාකාරකම්වලට සම්බන්ධ පහසුකම් සපයන්නන්, අපරාධවලට සම්බන්ධ සේවාදායකයින්, වින්දිතයන් සහ ශ්‍රී ලංකාව කේන්ද්‍ර කරගත් මිනිස් ජාවාරම් සිදුවීම්වල බොහෝමයක් ව්‍යර්ථ කිරීමට හැකි වී ඇත.

- මෙම ඒකකයට අදාළව පිහිටුවා ඇති ලියකියවිලි පරීක්ෂණාගාරය (Document Lab) මඟින් නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් ලියකියවිලිවල නිරවද්‍යතාවට තහවුරු කරගන්නා අතර එම තත්ත්වයන් මෙම දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙන්ම ගුවන් සේවා සමාගම් හා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ද ලබාදෙනු ලැබේ.

- 2024 වර්ෂයේ දී නව හවුල්කාරීත්වයන් සමඟ එක්ව මෙම ඒකකයේ අරමුණු හා ධාරිතා සංවර්ධනයෙහි දැවැන්ත සාර්ථකත්වයක් ලඟා කරගැනීමට හැකි විය. ඒ අනුව, ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය රැස්වීම් මාලා 4ක්, වැඩමුළු 6ක්, දැනුම්වත් කිරීමේ වැඩසටහන් 3ක් සංවිධානය කරන ලදී.

- ඊට අමතරව මෙම ඒකකය මඟින් අපරාධවලට පහසුකම් සපයන්නන් 32ක් සහ පුද්ගල ජාවාරමට ගොදුරු විය හැකි පුද්ගලයින් පරීක්ෂා කිරීම් 207ක් ද සිදු කළ අතර ප්‍රථම වරට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් මෙම ඒකකය මඟින් බාලි ක්‍රියාවලියේ කලාපීය සහයක කාර්යාලය සමඟ එක්ව කටයුතු කරනු ලැබීය.

## 1.5.6 තොරතුරු තාක්ෂණ හා ප්‍රත්‍යන්ත පාලන අංශය

පාලක (තොරතුරු තාක්‍ෂණ) අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**මූලික කාර්යභාරය**

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව සැලසෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීම වේ.

එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත් කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.

තවද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකරණ, ආරක්ෂක අංශ (පොලිසිය හා ත්‍රිවිධ හමුදා), ව්‍යවස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, රාජ්‍ය බැංකු හා මූල්‍ය ආයතන ඇතුළු විවිධ ආයතනවලින් ඉල්ලා සිටිනු ලබන, විවිධ පුද්ගලයන්ගේ විදේශ ගමන් සම්බන්ධ වාර්තා මෙම දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ පවතින තොරතුරු අනුව අදාළ ආයතන වෙත නිකුත් කිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

ඉහතින් දැක්වූ මූලික කාර්යය භාරයන්ට අමතරව පහත දැක්වෙන කාර්යයන් ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරනු ලබයි.

1) මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදී වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුලර් පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකොට සේවා ඵලදායිතාව ඉහළ නැංවීම.
2) දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
3) පවතින දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරිම (Upgrade).
4) උසාවි නියෝග මත මගී ගුවන් ගමන් පිළිබඳව අවශ්‍ය කටයුතු යාවත්කාලීන කිරිම.
5) මෙම කාර්යය දැනට, මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන උසාවි නියෝග මත සිදු කරනු ලබන අතර, එම කාර්යයේදී සිදු විය හැකි ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා, අදාළ Interface Development මගින් ගුවන් ගමන් තහනම් කිරීමේ කටයුතු උසාවිය වෙතම පැවරීම සඳහා Central Black List ව්‍යාපෘතිය වැඩි දියුණු කරමින් පවතී.මෙය 2025 වර්ෂය තුල සපුරාලීමට කටයුතු කරනු ලැබේ.
6) පාලක(ගමන් බලපත්)ගේ නියෝග පරිදි ගමන් බලපත් අසාදු ලේඛණගත කිරීමට අවශ්‍ය කටයුතු කිරිම.

**අස්ථානගත වූ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර ඒකකය (SLTD)**

අස්ථානගත වූ හෝ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබාදෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් සෘජුවම හෝ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කර එම ගමන්බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, ජාත්‍යන්තර පොලිසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන් බලපත්‍රයක් මගින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැලැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධී කටයුතු සිදුවීම වැලැක්වීම (SLTD) පද්ධතියේ මූලික අරමුණ වේ.

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශීය දූත මණ්ඩල (SLDM) විසින් ගමන් බලපත්‍ර 3921ක් දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 354ක් ජාත්‍යන්තර පොලිසියේ දත්ත පද්ධතියට යවා ඇත. ඉතිරි ගමන් බලපත්‍ර නැවත අයදුම්කරුවන් වෙත ලැබුණු බවට වාර්තා වී ඇත.

**ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)**
ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබාදීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයයන් සෘජුව සම්බන්ධතා පවත් වන්නේ මෙම අංශය සමග වන අතර අවශ්‍ය විටක දී වීසා නිකුත් කිරිමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මගින් විමසුම් 555 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

**නැවත භාර ගැනීමේ ගැටළු කළමනාකරණ පද්ධතිය(RCMS)**

විදේශයක දී පිටුවහල් කරන ශ්‍රී ලාංකිකයින් සඳහා ඒ ඒ රටවල පිහිටුවා ඇති තානාපති කාර්යාල මගින් ඔවුන්ගේ ශ්‍රී ලාංකික භාවය තහවුරු කර, ඉන්පසු පරිගණක පද්ධතිය මගින් අප දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබයි. එම පරිගණක පද්ධතිය තුලින්ම දෙපාර්තමේන්තුව සතු ගමන් බලපත් දත්ත සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දත්ත උපයෝගී කර ගෙන අවසාන වශයෙන්, පුද්ගලයාගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කිරීම කරනු ලබයි. ඉන්පසු තාවකාලික ගමන් ලියවිල්ලක් නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබා දේ.

### 1.5.6.1 තොටුපළ ශාඛාව
ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරමින්, එකී විදේශ ගමන් බලපත්‍ර දරන්නන් ශ්‍රී ලංකාවෙන් පිටවීම විධිමත් කිරීම, ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රධාරීන් ඇතුළු සමස්ත ආගාමිකයන්ගේ හා විගාමිකයන්ගේ නිෂ්කාශණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව, ජාතික ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදෙමින්, ජාතික ආර්ථිකයට ධනාත්මක උත්තේජනයක් ඇතිවන පරිදි, දිවයින වටා පිහිටි සියලුම සක්‍රීය, අනුමත මුහුදු හා ගුවන් තොටුපලවලදී ප්‍රත්‍යන්ත පාලනය ඉටුකිරීම. ඒ සඳහා අවශ්‍ය භෞතික හා මානව ආධාරක සේවා සැපයීම, සමස්ත සේවාලාභීන් සම්බන්ධිකරණය කිරීම. මීට අමතරව ශ්‍රී ලංකාව තුළ විදේශ දූත මණ්ඩල හා වීසා අංශ ස්ථාපනය කර නොමැති විදේශ රටවලට ශ්‍රී ලාංකික ගමන් බලපත්‍ර දූතායනය (කූරියර්) කිරීමට අවශ්‍ය නෛතිකමය අධිකාරය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙනුවෙන් ලබාදීම. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ නීතිය බලාත්මක කිරීමේ ආයතනවලට අවශ්‍ය වන ප්‍රත්‍යන්ත පාලන තොරතුරු අවශ්‍යතාවය මත ලබාදීම.

ශ්‍රී ලංකාව තුළ වීසා අංශ ස්ථාපිත කර නොමැති රටවල් සඳහා පිටත්ව යාමට බලාපොරොත්තුවන ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රධාරීන්ට ශ්‍රී ලංකාවේ සිට රටෙහි තානාපති කාර්යාලයට අදාළ ගමන් බලපත්‍ර දූතායනය (කූරියර්) කිරීමට අදාළ නෛතික අවසරය ලබාදීම.

- ශ්‍රී ලංකාවට ගොඩබසින විදේශ නාවික කාර්ය මණ්ඩල හා සම්බන්ධ වන බැඳුම්කරවලට අදාළ නාවික නියෝජිතයන් හා එළඹීම.
- සියලුම අනුමත සක්‍රීය තොටුපලයන්හි භෞතික හා මානව සංවර්ධන කටයුතු සමාලෝචනය හා අවශ්‍ය අංශ සමග සම්බන්ධිකරණය.
- තොටුපලයන්හි ඉදිරි සංවර්ධන කටයුතු පුරෝකථනය.
- තොටුපල අංශයට සම්බන්ධිත කරුණුවල දී අදාළ නියෝජනයන් ලබාදීම.

- මගී නෞකා මගින් ශ්‍රී ලංකාවේ සංචාරයන් සඳහා පැමිණීමට බලාපොරොත්තුවන මගීන්ට අවශ්‍ය නිෂ්කාශණ කටයුතු දිය මතදී ලබාදීම සඳහා නිලධාරීන් හා අවශේෂ කාර්ය මණ්ඩල පිටත්කර යැවීම හා සියලු සම්බන්ධීකරණ කටයුතු.
- සිවිල් ගුවන් සේවා අධිකාරිය, ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම අදාළ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදාළ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නැව් නියෝජිතායතනය (CASA), ගුවන් සේවා සමාගම් නියෝජිතයන්, අදාළ නියෝජිතායතන (AOC) වැනි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශ ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- තොටුපල කටයුතු හා සම්බන්ධිත වෘත්තීය සමිති හා සම්බන්ධීකරණ කටයුතු.

**කාර්යයන්**

1. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිටවන මගීන්ගේ නිෂ්කාශණ කටයුතු ඉටුකිරීම.
2. විදෙස් රටවල තානාපති කාර්යාල ශ්‍රී ලංකාව තුල ස්ථාපනය කර නොමැති රටවල් සඳහා ඇතුළුවීමට අවශ්‍ය වීසා ලබා ගැනීමට අවශ්‍ය වන පුද්ගලයන්ගේ ගමන් බලපත් අදාළ තානාපති කාර්යාල ඇති රටවල් වෙත තැපැල් මඟින් යැවීම (කුරියර් කිරීම) සඳහා අනුමැතිය ලබාදීම.
3. ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
4. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශික නාවික කාර්යමණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම.
5. විදේශගත වූ මඟීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුළත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම.
6. ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (Electronic Travel Authorization) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපලවල දී විද්‍යුත් සංචරණ අනුමැතිය ලබාදීම.
7. උසාවි මඟින් නිකුත් කර ඇති රටින් පිටවීම හා මෙරටට පැමිණීම තහනම් නියෝග ක්‍රියාත්මක කිරීම හා වෙනත් ආයතන මඟින් පුද්ගලයන් රටින් පිටවීම හා රටට පැමිණීම පිළිබඳව විමසා එවන ලිපි සම්බන්ධ රාජකාරි.
8. ශ්‍රී ලංකාවෙන් පිටවීමේ දී හා ශ්‍රී ලංකාවට පැමිණීමේ දී තොටුපලවල දී මඟීන් විසින් සම්පූර්ණ කළයුතු ආගමන / විගමන පත්‍රිකා නිකුත් කිරීම.
9. තොටුපල වලට අනුයුක්ත ආගමන හා විගමන නිලධාරීන්ගේ සේවාවන් මෙහෙයවීම, අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.

## 1.5.7 පුරවැසි අංශය

මෙම පුරවැසි අංශයේ කටයුතු ක්‍රියාත්මක වනු ලබන්නේ 1948 අංක 18 දරන පුරවැසි පනතින් ලද ව්‍යවස්ථාපිත බලය යටතේය. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිල බලය ලැබෙන්නේ අදාලරේඛීය අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ලේකම්වරයාට වන අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයකු මගින් ක්‍රියාත්මක වන අතර එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මගින් ක්‍රියාත්මක වේ. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි, ආගාමික හා විගාමික පනතින් පාලනය වන, විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ ඍජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්මේන්තුවෙහි ස්ථාපිත කර ඇත.

## 1.5.8 ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ගණකාධිකාරි (වියදම්) සහ ගණකාධිකාරි (ආදායම්) ගේ මෙහෙය වීම යටතේ, ගෙවීම් ඒකකය, අයවැය ඒකකය, ආදායම් ඒකකය ලෙස ඒකක තුනක් යටතේ දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු ක්‍රියාත්මක වේ.

**කාර්යභාරය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය ගිණුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් එකතු කිරීම, ගිණුම් ගත කිරීම සහ අධික්ෂණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කළමනාකරණය, පොදු තැන්පතු ගිණුම් කටයුතු සහ දෙපාර්තමේන්තුවට අයත් වත්කම් කළමනාකරණය සිදුකරයි. මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වියදම්, අනුමත ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව වියදම් දැරීම සඳහා මගපෙන්වීම සිදුකරන අතර වාර්ෂික සහ මාසික වාර්තාවන් ලෙස වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, වාර්ෂික ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සහ පොදු තැන්පතු ගිණුම් වාර්තාව පිළියෙල කර නියමිත දිනයන්හි අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය හා අදාල අනෙකුත් දෙපාර්තමේන්තු සහ ආයතන වෙත ඉදිරිපත් කිරීම ඇතුලු දෙපාර්තමේන්තුවේ සියලුම මූල්‍ය කටයුතු මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම ගිණුම් අංශය තුළින් සිදුවේ.

**ආදායම් හා ඉලක්කගත ප්‍රගතිය**

2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත මුළු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 35.10 ක් වූ අතර 2024 වර්ෂයේ සත්‍ය වශයෙන් උපයන ලද මුළු ආදායම රුපියල් බිලියන 38.01 විය. 2023 වර්ෂයේ උපයන ලද මුළු ආදායම වන රු.බිලියන 42.77 සමග සැසඳීමේදී 2024 වර්ෂයේ මුළු ආදායම රුපියල් බිලියන 4.76 කින් පහල ගොස් ඇති අතර නව විදෙස් ගමන් බලපත් නිකුත් කිරීම සීමා කිරීම මෙයට හේතුවී ඇත.

**2024 වර්ෂයේ සත්‍ය වියදම**

2024 වර්ෂයේ දෙපාර්තමේන්තු වියදම් සඳහා ලබාදුන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන **5,247.31** ක් විය. එම ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන **2,650.87** ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන්ද, රුපියල් මිලියන **2,596.44** ක් මූලධන වියදම් වෙනුවෙන්ද අනුමත කර තිබුණි. 2024 වර්ෂයේ සමස්ථ සත්‍ය වියදම රුපියල් මිලියන **4,667.75** ක් වූ අතර එයින් රු.මිලියන **2,382.59** ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ද රු.මිලියන **2,285.16** ක් මූලධන වියදම් වෙනුවෙන් ද වැය කරන ලදී.

## 1.5.9 අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.
අංශයේ අරමුණු හා කාර්ය භාරය

**අංශයේ අරමුණු**

- ❖ දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට දායක වන පරිදි මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යාම
- ❖ දෙපාර්තමේන්තුවට නියම කෙරුණු හෝ දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමෙහි හා සැලසුම් සහ වැඩ සටහන් සපුරාලීමෙහිලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගණන් දීමේ නිලධාරියාට සහ ප්‍රගති අන්වේෂණ කමිටුවට සහාය වීම
- ❖ උචිත අවස්ථාවල දී මෙම කර්තව්‍යයන්හි නිරත අයවලුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රගති/ අන්වේෂණ කමිටුව අතර සම්බන්ධ කාරකය ද වශයෙන් ක්‍රියා කිරීම

**අංශයේ කාර්ය භාරය**

- ❖ වැරදි හා වංචා වැළැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරීත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම
- ❖ ගිණුම් සහ වෙනත් වාර්තා වල විශ්වාසනීයභාවය නිශ්චිය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම
- ❖ කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාව ඇගයීම
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි
/මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

කේ.පී.එස්.පී. වීරකෝන්
ප්‍රධාන ගණකාධිකාරි (වැ.බ)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර
බත්තරමුල්ල.

ආදායම් ගණන්දීමේ නිලධාරි නම, තනතුර සහ අත්සන

බී.එම්.ඩී. නිලූෂා බාලසූරිය
පාලක ජනරාල් (වැ.බ)
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

* තමන්ට අදාළ ආදායම් සංකේතය පමණක් ඇතුළත් වන පරිදි ආකෘති පත්‍රය සංශෝධනය කර ගත යුතු ය.

මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

ශීර්ෂ අංක 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

රු.000

| වත්කම් ශේෂය | කේත විස්තරය | 2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව ශේෂය | 2024.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම් කරණයට නියමිතය | ප්‍රගතිය ලෙස වාර්තා කිරීම % |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 106,351,770.48 | 106,351,770.48 | - | 100% |
| 9152 | යන්ත්‍ර හා උපකරණ | 1,137,566,560.61 | 1,137,566,560.61 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 521,932,731.45 | 521,932,731.50 | - | 100% |
| 9153 | ඉඩම් | 66,945,000.00 | 66,945,000.00 | - | 100% |
| | එකතුව | 1,832,796,062.54 | 1,832,796,062.59 | | |

පිළියෙල කලේ ..........................

එල්.එම්.ඩී. දහනායක (කළ. සේ. නිල.)

පරීක්ෂා කලේ ..........................

යූ.ඩබ්.එන්.ජේ. ගුණතුංග (ගණකාධිකාරී - ආදායම්)

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස්(මුදල්)

දිනය 2025/07/04

02 JUL 2025

# 04 පරිච්ඡේදය - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ජනතාවට සුවිශේෂී සේවාවක් සපයන අතරතුර ශ්‍රී ලංකා රජය වෙනුවෙන් රටට ආදායම් උත්පාදනය කිරීමේ කාර්යභාරයෙහි නිරත වී සිටින ප්‍රධාන රාජ්‍ය ආයතනයකි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක වනුයේ එක්දින සේවාව යටතේ ලැබුණු ගමන්බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව දිනක් තුල නිකුත් කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය, ද්විත්ව පුවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කළ දිවිත්ව පුරවැසි සහතිකපත් සංඛ්‍යාවේ ප්‍රතිශතය, ඉ - සංචරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ අයදුම්පත් සංඛ්‍යාවට අනුව ඉ - සංචරණ අනුමැතිය ලබා දුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය හා වාර්ෂික ඉලක්කයන්ට අනුව ආදායම ඉපැයීමේ ප්‍රතිශතය වේ.

01.එක්දින සේවාව යටතේ ලැබුනු ගමන්බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය

2024 වර්ෂය තුල එක්දින සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 3, 72,133 ක් වන අතර නිකුත් කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාව 369,708 ක් වේ. (2023 වර්ෂයේ අයදුම්පත් ද ඇතුළත් ය.) එනම් එක්දින සේවාව යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිශතය 99.35 %කි.

02.ද්විත්ව පුවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාවට අනුව නිකුත් කළ ද්විත්ව පුරවැසි සහතිකපත් සංඛ්‍යාවේ ප්‍රතිශතය

ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් 13039ක් අතුරින් 2024 වර්ෂයේ 9487 දෙනෙකුට ද්විත්ව පුරවැසිභාවය ලබාදීමට කටයුතු කරන ලදී. එනම් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ද්විත්ව පුරවැසිභාවය ලබාදීමේ ප්‍රතිශතය 72.76%කි.

03.ඉ - සංචරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ අයදුම්පත් සංඛ්‍යාවට අනුව ඉ - සංචරණ අනුමැතිය ලබා දුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය

ඉ - සංචරණ අනුමැතිය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් 1,088,765ක් අතුරින් 2024 වර්ෂයේ 1,087,368 දෙනෙකුට ඉ - සංචරණ අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදී. එනම් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට අනුව ඉ - සංචරණ අනුමැතිය ලබාදීමේ ප්‍රතිශතය 99.87%කි.

04.වාර්ෂික ඉලක්කයන්ට අනුව ආදායම ඉපැයීමේ ප්‍රතිශතය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් සංරචක වනුයේ, ගමන් බලපත්‍ර නිකුත් කිරීම,විදේශ තානාපති කාර්යාල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීම, වීසා දීර්ඝ කිරීම හා නිකුත් කිරීම, විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා දීම, පුරවැසි සහ ද්විත්ව පුරවැසි සහතික පත් නිකුත් කිරීම,තොටුපළ ආශ්‍රිත කටයුතු වේ. 2024 වර්ෂයේ මුල පැවති ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන 35.10ක් වන අතර, 2024 වර්ෂයේ සත්‍ය වශයෙන් උපයන ලද මුළු ආදායම රුපියල් බිලියන 38.01ක් විය. එය 108.29% ක ආදායම් ඉපයීමේ කාර්ය සාධනයකි. ඒ අනුව ඇස්තමේන්තු කළ ආදායම ඉක්මවා යමින් ජාතික ආදායමට දායක වීමට අප දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි.

## 2024 වර්ෂයේ කාර්ය සාධන දර්ශක

| විශේෂිත කාර්ය සාධන දර්ශක | | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|---|
| | | 90%-100% | 75%-89% | 50%-74% |
| දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යසාධන දර්ශක | | | | |
| 1 | එක්දින සේවාව යටතේ ලැබුනු ගමන් බලපත්‍ර අයදුම්පත් සංඛ්‍යාව අනුව නිකුත් කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාව | √ | | |
| 2 | ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව අනුව නිකුත් කළ ද්විත්ව පුරවැසි සහතික සංඛ්‍යාව | | | √ |
| 3 | ඉ - සංචරණ අනුමැතියලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ අයදුම්පත් සංඛ්‍යාව අනුව අනුමැතිය ලබා දුන් සංඛ්‍යාව | √ | | |
| 4 | වාර්ෂික ඉලක්කයන්ට අනුව ආදායම ඉපැයීමේ ප්‍රතිශතය | √ | | |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධන දර්ශක | | | | |
| 1 | වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය නව ගොඩනැගිල්ලකට ගෙන යාම - අදියර II | √ | | |
| 2 | තොටුපල නවීකරණය කිරීම | | √ | |
| 3 | යන්ත්‍රෝපකරණ හා උපකරණ වැඩිදියුණු කිරීම | | √ | |
| 4 | වාහන නඩත්තු කිරීම | | √ | |
| 5 | කාර්යාලයේ අවශ්‍යතා අනුව කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ මිලදි ගැනීම | √ | | |
| 6 | ලැමිනේටින් යන්ත්‍ර 12ක් මිලදී ගැනීම | √ | | |
| 7 | ලැප්ටොප් 50ක් මිලදී ගැනීම | √ | | |
| 8 | පරිගණක 75ක් මිලදී ගැනීම | | √ | |
| 9 | ජාලකරණ උපාංග මිලදී ගැනිම | √ | | |
| 10. | ටෝකන් ප්‍රින්ටින් යන්ත්‍ර 5ක් මිලදී ගැනීම | √ | | |
| 11. | Printers මිලදී ගැනීම | √ | | |
| 12. | කාර්යාල උපකරණ මිලදී ගැනීම | √ | | |
| 13.. | Note Book 5ක් මිලදී ගැනීම | √ | | |
| 14. | Upgrade of Departure Terminal switch for e-Gate project | √ | | |
| 15. | Upgrade of Network 24 port SEP+10G switch at BIA | √ | | |
| 16. | Replacing connectivity with SLT Rack switch and data center at BIA | √ | | |
| 17. | Fiber Network Infrastructure for data center and Departure / Arrival Terminal connectivity at BIA | √ | | |

| විශේෂිත කාර්ය සාධන දර්ශක | | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|---|
| | | 90%-100% | 75%-89% | 50%-74% |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධන දර්ශක | | | | |
| 18. | Replacement of network switch for CID and SIS connection (24 port Fiber switch) | √ | | |
| 19. | Kaspersky virus guard | √ | | |
| 20. | Purchasing core switch other switches for Head office data center | √ | | |
| 21. | CCTV installation | | √ | |
| 22. | කටුනායක විවේකාගාරය නවීකරණය කිරීම | √ | | |
| 23. | **Visa system re-vamp** | √ | | |
| 24. | ප්‍රතිපත්ති අංශය සඳහා ලේඛන කළමනාකරණය කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම | √ | | |
| 25. | **Windows License** | | | |
| 26. | සේවක පුහුණුව | √ | | |
| 27. | හිස් ගමන් බලපත්‍ර 500,000ක් මිලදී ගැනීම | √ | | |
| 28. | විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය | √ | | |

# 05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50- 74% | 75% - 100% |
| තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක 16 සාමය,යුක්තිය, ශක්තිමත් ආයතනය | ත්‍රස්තවාදය හා ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට අදාල ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා ඒහා සම්බන්ධ අනෙකුත් ආයතන හා සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම. | * ආගාමික හා විගාමික පනත උල්ලංගනනය කරමින් මෙරට රැඳී සිටින විදේශිකයන් පිළිබඳ සිදු කල විමර්ශනයන් පාදක කොටගෙන රටෙන් ඉවත් කරන ලද විදේශිකයින් සංඛ්‍යාව | | | √ |
| | | * ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් පුද්ගලයින් සම්බන්ධයෙන් සිදු කල විමර්ශනයන් පදනම් කරගෙන රටට ඇතුළු වීම වැළැක්වූ විදේශිකයන් සංඛ්‍යාව. | | | √ |
| | මිනිස් ජාවාරම්, හා තැනැත්තන් වෙළඳාම වැළැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම. | * තැනැත්තන් වෙළඳාම සම්බන්ධයෙන් සිදු කල විමර්ශන පාදක කොට ගෙන හඳුනාගන්නා ලද වින්දිතයන් සඳහා සහන සැලසූ සංඛ්‍යාව | | | √ |
| | | * 1948 අංක දරණ ආගාමික විගාමික පනත උල්ලංඝනය කරමින් මෙරටින් පිටවීමට තැත්කරන පුද්ගලයන් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව | | | √ |
| | වගවීමෙන් හා විනිවිදභාවයෙන් යුතුව ජනතාව වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවයක් ඉටු කිරීම. | | | | √ |

## 5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය

**තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආයතනය ලත් ජයග්‍රහණ (දර්ශක ඇසුරින් විස්තර කරන්න)**

1. ආගාමික හා විගාමික පනත උග්ගංඝනය කරමින් මෙරට රැඳී සිටින විදේශිකයන් පිළිබඳ සිදු කළ විමර්ශනයන් පාදක කොටගෙන රටෙන් ඉවත් කරන ලද විදේශිකයන් සංඛ්‍යාව

1.1 2024 වර්ෂය තුළ දී ක්ෂේත්‍ර ආවේක්ෂණ සිදු කරනු ලැබූ අතර එහිදී මුහුණ දුන් ප්‍රධානතම ගැටළුව වූයේ නවාතැන් ගන්නා ස්ථාන පිළිබඳව විදේශිකයන් ලබා දී තිබූ තොරතුරු අනුව ඔවුන් එම ස්ථානවල රැඳී නොසිටීම එමෙන්ම විද්‍යුත් සංචරණ අනුමැතිය සහිතව මෙරටට පැමිණීම අනිවාර්ය නොවීම නිසා අවශ්‍ය තොරතුරු පූර්ව ලබා ගැනීමට නොහැකි වීම ද විදේශිකයන්ගේ අධීක්ෂණ කිරීමට ඇති ප්‍රධාන බාධකයන්ය. එසේ නමුත්, දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය ඇසුරින් දුරස්ථ ආවේක්ෂණය මඟින් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටින හා ලංකාවට පැමිණෙන

විදේශිකයින්ගේ නිවැරදි තොරතුරු රැස්කිරීම, තොරතුරුවල නිවැරදි බව තහවුරු කිරීම හරහා විමර්ශන ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කිරීම සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලිය හරහා සැක සහිත විදේශීකයන්ගේ තොරතුරු විසා අංශය විසින් පවත්වා ගෙන යනු ලබන විපරම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

1.2 2024 වසරේදී ක්ෂේත්‍ර ආවේක්ෂණය යටතේ සිදුකළ සමස්ථ විමර්ශනයන් සංඛ්‍යාව 1305ක් වූ අතර දුරස්ථ ආවේක්ෂණය යටතේ, විදේශිකයන් 1088 දෙනෙකුගේ තොරතුරු විසා අංශය හරහා විපරම් ලේඛනයට ඇතුළත් කරන ලද අතර, විසා දිගු ලබාගැනීමේ දී විමර්ශන අංශය සඳහා අදාළ විදේශිකයා යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.විපරම් ලේඛනයට ඇතුළත් කරන ලද විදේශිකයන් 1088 දෙනාගෙන් 127 දෙනෙකු සඳහා විසා දිගු ලබාදීම නුසුදුසු බවට නිර්දේශ කරන ලදී.විසා දිගු ලබාදීම නුසුදුසු බවට නිර්දේශ කරන ලද 127 දෙනාගෙන් 105 දෙනෙකු පිරිමි පුද්ගලයන් වූ අතර බහුතරය බංගලාදේශ ජාතිකයන් වේ.

1.3 2024 වර්ෂයට අදාළව ක්ෂේත්‍ර ආවේක්ෂණ තුළින් විමර්ශනයන්ට ලක්කළ සහ දුරස්ථ ආවේක්ෂණය තුළින් විපරම් ලේඛනයට ඇතුළත් කළ සමස්ථ විදේශීකයන් සංඛ්‍යාව 2393 වන අතර, ඒ අතරින් එම වර්ෂයට අදාළව විදේශීකයන් 942 දෙනෙකු සඳහා වැඩිදුර විමර්ශන කටයුතු මෙහෙයවා ඇත.

1.4 2024 වර්ෂයට අදාළව රඳවා තැබීමේ මධ්‍යස්ථානවලට විදේශීකයන් 913 ඇතුළත් කර ඇති අතර, අදාළ වසර තුළ ඉවත් කිරීමේ නියෝග හා පිටුවහල් කිරීම් මත විදේශීකයන් 867ක් මෙරටින් ඉවත් කර ඇත. දුරස්ථ හා ක්ෂේත්‍ර ආවේක්ෂණය හරහා සිදු කරන ලද විමර්ශනයන්ගෙන් පසු විදේශීකයන් 460 දෙදෙනෙකුට මෙරටින් ඉවත් වීමට දැනුම් දෙන ලදි. ඒ අනුව, 2024 වර්ෂයට අදාළව, විමර්ශනයට ලක්වූ විදේශිකයන්ගෙන් ආගමන හා විගමන පනත උල්ලංඝණය කළ විදේශීකයන් 1327 දෙනෙකු මෙරටින් ඉවත් කිරීමට කටයුතු කර ඇත.

1.5 විමර්ශන අංශයේ නියෝග පරිදි විදේශීය ජාතිකයන් 28 දෙනෙකු 2024 වර්ෂය තුළ අදාළ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, වීසා නියමාණුකූල බවට පත් කරගන්නා ලදී.

2. ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවදානම් පුද්ගලයින් සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයන් පදනම් කරගෙන රටට ඇතුළු වීම වැළැක්වූ විදේශීකයන් සංඛ්‍යා

2.1 2024 වර්ෂයේ වීසා සඳහා අයදුම් කළ විදේශීකයන්ගෙන් 26921ක් වූ අවධානයට යොමු වූ අයදුම්කරුවන් අතරින් අවදානම්සහගත විදේශිකයන් 10746 සංඛ්‍යාවක් පරීක්ෂා කළ අතර, එම අයදුම්පත් අතරින් විදේශීකයන් 60ක් අවදානම් තක්සේරුකරණය හරහා ප්‍රතික්ෂේප කරනු ලැබීය. ඉන් වැඩි පිරිසක් පාකිස්ථාන ජාතිකයන් විය.

2.2 2024 වර්ෂයට අදාළව දේශසීමා ආවේක්ෂණ ඒකකය විසින් හඳුනාගත් ව්‍යාජ ලේඛන භාවිත කළ විදේශීකයන් 133 දෙනෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වැඩිදුර විමර්ශන කටයුතු සඳහා භාරදෙන ලදී.

3. සංවිධානාත්මක අපරාධකරුවන් ලෙස සැලකෙන මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරම් අවම කිරීම සහ විසා අවභාවිතයන් පිළිබඳ විමර්ශනයට අවශ්‍ය සහාය ලබා දීමේ අරමුණ ඇතිව 2019 මුල් මස සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ කේන්ද්‍ර කර ගනිමින් විමර්ශන ශාඛාව යටතේ පිහිටුවනු ලැබූ දේශ සීමා අවශේෂණ ඒකකය මගින් එසේ නීති උල්ලංඝනය කරනු ලැබූ 2024 වර්ෂයට අදාල ශ්‍රී ලාංකිකයන් 112 ක් හා විදේශිකයන් 21ක් අත්අඩංගුවට ගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වැඩිදුර විමර්ශනයට භාර දී ඇත.

4. ව්‍යාජ මැලේසියානු විදේශ ගමන් බලපත්‍ර භාවිත කරමින් ශ්‍රී ලාංකික දරුවන් මැලේසියාව හරහා යුරෝපයට රැගෙන යාමේ ජවාරම අනාවරණය කරගැනීම.

4.1 ව්‍යාජ මැලේසියානු විදේශ ගමන් බලපත්‍ර භාවිත කරමින් මැලේසියාව හරහා යුරෝපය වෙත ශ්‍රී ලාංකීක දරුවන් රැගෙන යාමේ ජවාරම, පසුගිය වසර තුළ විමර්ශන ශාඛාවට අදාළව අවදානම් තක්සේරු මධ්‍යස්ථානය විසින් අනාවරණය කරගත් විශේෂ විමර්ශනයක් විය. ඒ අනුව, පසුගිය වසරේ දී වයස අවුරුදු 5 ත් 17 ත් අතර ළමුන් 17 දෙනෙකු පමණ සිය දෙමව්පිය කැමැත්ත මත මෙරටින් මැලේසියාවට සංක්‍රමණය වී ඇති අතර ඔවුන් නැවත මෙරටට පැමිණ නොමැත. ප්‍රත්‍යන්ත දත්ත පද්ධතිය දීර්ඝ ලෙස විශ්ලේෂණය කිරීමෙන්, සැකකරුවන්ගේ සංචාරක දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් සහ ස්ථානීය පරීක්ෂණ හරහා තොරතුරු රැස් කරගනිමින් මෙම ජවාරමට සම්බන්ධ සැකසහිත පුද්ගලයින් හඳුනාගැනීමට විමර්ශන ශාඛාවට හැකි වී ඇත.

# 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන මට්ටම ඉහළ නැංවීමට සහ ඉහළ කාර්යසාධන මට්ටමක් අඛණ්ඩව පවත්වාගෙන යාම උදෙසා පුහුණු හා සංවර්ධන ඒකකය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා සංවර්ධන වැඩසටහන් විශාල දායකත්වයක් ලබා දේ.

දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික ස්ථාන මාරුවීම් පදනමින් හා නව බඳවා ගැනීම් යටතේ කාර්යය මණ්ඩලය සඳහා එක්වන නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු කාර්යභාර්ය පිළිබඳ ලබා දෙන විධිමත් පුහුණුවට අමතරව එම නිලධාරීන් දෙපාර්තමේන්තුවේ සේවය කරන කාල සීමාව තුළ ඔවුන්ට අවශ්‍ය වන දැනුම හා ප්‍රායෝගික පුහුණු යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ.

ඒ අනුව, පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා දේශීය වශයෙන් අයවැය මඟින් වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන මිලියන 5 කි. 2024 වර්ෂයේ පුහුණු හා සංවර්ධන අංශය ක්‍රියාත්මක කළ සමස්ථ වැඩසටහන් සංඛ්‍යාව 53 ක් වන අතර එයින් වැඩසටහන් 33 ක් දේශිය ප්‍රතිපාදන මඟින් ද, 20ක් තනාපති කාර්යාල, ජාත්‍යන්තර සංවිධාන හා බාහිර ආයතනයන්ගේ අනුග්‍රාහකත්වය යටතේ පවත්වන ලදී.

පුහුණු හා සංවර්ධන ඒකකයේ 2024 වසර තුල නිලධාරීන් කාණ්ඩ සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත වගුවෙන් සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

**එක් එක් නිලධාරීන් කණ්ඩය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව**

| | නිලධාරී කාණ්ඩය | පවත්වන ලද වැඩසටහන් ගණන | | සමස්ථ පුහුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | විශේෂිත | පොදු | |
| 01 | විධායක / මාණ්ඩලික නිලධාරීන් | 3 | 19 | 22 |
| 02 | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී / බලයලත් නිලධාරී | 23 | 4 | 27 |
| 03 | සංවර්ධන නිලධාරී | 2 | 21 | 23 |
| 04 | කළමනාකරණ සේවා නිලධාරී | 2 | 21 | 23 |
| 05 | ගමන් බලපත් සහයක | - | 11 | 11 |
| 06 | කාර්යාල කාර්ය සහයක | - | 21 | 21 |
| 07 | රියදුරු මහතුන් | 1 | 6 | 7 |
| 08 | අනෙකුත් | - | - | 3 |




## 6.3 මානව සම්පත් සංවර්ධනය - 2024 (පුහුණු හා සංවර්ධන ඒකකය)

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 01 | සේවක අනුස්ථාපන වැඩසටහන (Orientation Programme) | ජනවාරි 2 - 9 | දින 05 | ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් - 13 | 15,454 | දේශීය | විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 02 | පුද්ගලයින් ජාවාරම් කිරීම සහ ජාවාරම් කිරීම සම්බන්ධ අපරාධ ජාල බිඳ දැමීම පිළිබඳ විදේශීය පුහුණුව Foreign Training on Disruption of Criminal Networks People Smuggling and Trafficking in Persons in Thailand | ජනවාරි 23 - 25 | දින 03 | බලයලත් නිලධාරී 01 | - | විදේශීය | මිනිස් ජාවාරම් සහ මිනිස් ජාවාරම් කිරීමේ අපරාධ ජාලයන් විමර්ශනය කිරීම පිළිබඳ පුහුණු කිරීම. |
| 03 | පුද්ගල ආකල්ප, හැසිරීම් හා පුරුදු සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන | ජනවාරි 31 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | - | දේශීය | මිනිස් ජාවාරම් සහ ජාවාරම් සම්බන්ධයෙන් යාවත්කාලීන කිරීම් සහ වැඩිදියුණු කිරීම සඳහා සාකච්ඡා කිරීම. |
| 04 | සේවක අනුස්ථාපන වැඩසටහන (Orientation programme) - II | පෙබරවාරි 5 - 9 | දින 05 | ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරින් 7 | 44,658 | දේශීය | විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන්ට දෙපාර්තමේන්තු වේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තු වේ උප සංස්කෘතිය හඳුනා ගැනීම. |
| 05 | බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | පෙබරවාරි 13 | දින 01 | ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරින් 35 | 41,640 | දේශීය | ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුල්වීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම හා ගුවන් තොටුපල ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 06 | Training Program on Interviewing Techniques (සම්මුඛ පරීක්ෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුව) | පෙබරවාරි 26 – මාර්තු 01 | දින 05 | බලයලත් නිලධාරී 8 | 41,250 | දේශිය/ විදේශිය (RCMP) | සාක්ෂිකරුවෙකු වින්දිතයෙකු හෝ සැකකරුවකු සමග සම්මුඛ සාකච්ඡා කිරීමේ හැකියාව, සම්මුඛ පරීක්ෂණ විෂය සංවාදයට සම්බන්ධ කර ගැනීමේ හැකියාව හා තොරතුරු වල විශ්වාසනියත්වය සහතික කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම සඳහා ඔවුන්ගේ කුසලතා හා දැනුම වර්ධනය කිරීම. |
| 07 | දෙමළ භාෂා පාඨමාලාව | පෙබරවාරි 29 - ඔක්තෝබර් 25 | (පැය150) | සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී - 16 | 160,000 (එක් අයෙකුට 10,000) | දේශිය | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව නිලධාරීන්ගේ භාෂා කුසලතාව ඉහළ නැංවීම මඟින් මහජන සම්බන්ධතාවය වර්ධනය කිරීම හා වඩාත් යහපත් සේවාවක් ලබා දීම. |
| 08 | ද්වි පාර්ශවික ශ්‍රම සංක්‍රමණය වීම පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (Bilateral labor Migration Instrument for Government ) | මාර්තු 6 - 7 | දින 02 | බලයලත් නිලධාරී 02 | - | විදේශිය (ILO) | ද්විපාර්ශවික ශ්‍රම සංක්‍රමණික සැලසුම් පිළිබඳ සැලසුම් කිරීම, සාකච්ඡා කිරීම සහ පසු විපරම් කිරීම ගැන රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම. |
| 09 | ආතතිත හරණය (Stress Release) සඳහා විධායක හා මාණ්ඩලික නිලධාරී පුහුණුව | මාර්තු 8 - 9 | දින 02 | විධායක හා මාණ්ඩලික නිලධාරීන් | - | දේශිය (අනුග්‍රාහක) | වෙහෙසකරී රාජකාරිකාරීයෙන් මිදී ආතතිය තුරන්කර සේවා කාර්යක්ෂමතාව හා නිලධාරීන් අතර අනෝන්‍ය සහයෝගීතාවය වර්ධනය කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 10 | මිනිස් ජාවාරම් සහ පුද්ගල ජාවාරම් විමර්ශනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන (Human Trafficking & people Smuggling Investigations Training Program ) | මාර්තු 4 - 15 | සති 02 | බලයලත් නිලධාරී 02 | - | විදේශීය | මිනිස් ජාවාරම් සහ මිනිස් ජාවාරම් වැරදි විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා බලයලත් නිලධාරීන්ගේ උනන්දු වීම. |
| 11 | බුද්ධි තොරතුරු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (Training program on Information Gathering & Intelligence – I) | මාර්තු 11 - 15 | දින 05 | බලයලත් නිලධාරී 20 | 95,000 එක් (වැඩසටහනක් සඳහා) | දේශීය (රාජ්‍ය බුද්ධි සේවාව) | බුද්ධි තොරතුරු වල වැදගත්කම හා ඒවා ලබාගත හැකි විවිධ මූලාශ්‍රයන් හා ප්‍රභේදයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක වන ක්‍රමවේදය වටහා ගැනීම. |
| 12 | සේවක අනුස්ථාපන පුහුණු වැඩසටහන (Orientation Programme) | මාර්තු 18 - 22 | දින 05 | ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් | 82,670 | දේශීය | විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම. |
| 13 | බුද්ධි තොරතුරු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (Training program on Information) Gathering & Intelligence – II) | මාර්තු 18 - 22 | දින 05 | බලයලත් නිලධාරී 20 | 95,000 | දේශීය (රාජ්‍ය බුද්ධි සේවාව) | බුද්ධි තොරතුරු වල වැදගත්කම හා ඒවා ලබාගත හැකි විවිධ මූලාශ්‍රයන් හා ප්‍රභේදයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක වන ක්‍රමවේදය වටහා ගැනීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 14 | ශ්‍රී ලංකා දේශසීමා ස්ථානවල සිදුවන මිනිස් ජාවාරම්, සංක්‍රමණික ජාවරම් සහ ඒ පිළිබඳ සැක සහිත සිද්ධීන් හඳුනා ගැනීම සහ විමර්ෂණය කිරීම (Training workshop on Detection & Investigation of Suspected Cases of Human Traffick-ing / Smuggling of Migrants at Sri Lanka Border point ) | මාර්තු 19 | දින 01 | බලයලත් නිලධාරී 30 | - | විදේශීය (UNODC) | ශ්‍රී ලංකා දේශසීමා ස්ථානවල සිදුවන මිනිස් ජාවරම්, සංක්‍රමණික ජාවරම් සහ පිළිබඳ සැක සහිත සිද්ධීන් හඳුනා ගැනීම සහ විමර්ෂණය කිරීමට අදාළ වන නෛතික රාමුව හා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය ලබා දීම. |
| 15 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තුළ නාවික නිලධාරීන්ගේ ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව | මාර්තු 26 | දින 01 | නාවික නිලධාරීන් | 10,920 | දේශීය | නාවික හමුදාවේ නිලධාරීන් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාර්ය සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා එම ක්‍රියාවලිය සිදුවන ආකාරය අධ්‍යනය කිරීම. |
| 16 | බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | මාර්තු 27 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 53,460 | දේශීය | ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුල්වීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම හා ගුවන් තොටුපල ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම. |
| 17 | බුද්ධි තොරතුරු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (Training program on Information Gathering & Intelli-gence – III) | අප්‍රේල් 1- 5 | දින 05 | බලයලත් නිලධාරීන් 20 | 95,000 | දේශීය (රාජ්‍ය බුද්ධි සේවාව) | බුද්ධි තොරතුරු වල වැදගත්කම හා ඒවා ලබාගත හැකි විවිධ මූලාශ්‍රයන් හා ප්‍රභේදයන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක වන ක්‍රමවේදය වටහා ගැනීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 18 | ජනහිතවාදී, විවෘත හා වගකිවයුතු රාජ්‍යයක් සඳහා රාජ්‍ය සේවා නිලධාරීන්ගේ වගකීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | අප්‍රේල් 8 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 15,910 | දේශීය | මහජනතාවට වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ලබාදීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම. |
| 19 | පුද්ගලානුරෝපණ අංශයේ නිලධාරින් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව (Out Bound Training) | මැයි 11 - 12 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 326,270 | දේශීය | නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 20 | අන්තර් ආයතන සම්බන්ධීකරණය මඟින් ශ්‍රී ලංකාවේ සමුද්‍රිය ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා සමුද්‍රිය වසම් දැනුවත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන ( Inter-agency Coordination on Maritime Domain Awareness to Strengthen Maritime Security in Sri Lanka) | මැයි 16 - 17 | දින 02 | බලයලත් නිලධාරීන් | - | විදේශීය (UNODC) | ශක්තිමත් නිති රාමුවක් සහ ඵලදායි ජාත්‍යන්තර සහයෝගීතාවය මඟින් සමුද්‍රී අපරාධ වැළැක්වීම, තහනම් කිරීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා සමාජීක රටවල හැකියාව වැඩිදියුණු කිරීම. |
| 21 | විමර්ශන හා සාක්ෂි හැසිරවීම පිළිබඳ පුහුණුව (Investigations & Evidence Handling Training Program) | මැයි 27 -31 | දින 05 | බලයලත් නිලධාරීන් 8 | - | විදේශීය (Australian Border Force) | ඒකරාශි කරගන්නා ලද විවිධ සාක්ෂි වඩා තාර්කිකව ඉදිරිපත් කිරීම හා නිවැරදි තිරණ ගැනීමට පෙළඹීම. |
| 22 | තැනැත්තන් වෙළඳාමේ වින්දිතයන් හඳුනා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන (Identifying & Responding to Human Trafficking ) | මැයි 27 - ජුනි 13 | දින 02 බැගින් සැසි 8 | බලයලත් නිලධාරීන් 40 (එක් සැසියකට) | - | විදේශීය (IOM) | මිනිස් ජාවාරම් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර නීති රාමුව හඳුනාගැනීම සහ දේශසීමා පාලන කාර්යයේහි විශේෂ අවධානයක් යොමු කරමින් විවිධ කාණ්ඩවල වින්දිතයන් හඳුනා ගැනීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 23 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තුළ ගුවන් හමුදා නිලධාරීන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | මැයි 29 | දින 01 | ගුවන් හමුදා නිලධාරීන් | 8790.00 | දේශීය | ගුවන් හමුදාවේ නිලධාරීන් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාර්ය සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා එම ක්‍රියාවලිය සිදුවන ආකාරය අධ්‍යනය කිරීම. |
| 24 | සේවා අනුස්ථාපන පුහුණු වැඩසටහන (Orientation Pro-gram) | ජුනි 3 - 7 | දින 05 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | - | දේශීය | විවිධ ආයතන වලින් අනුයුක්ත වන නිලධාරීන්ට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සරලව අවබෝධයක් ලබා දීම හා දෙපාර්තමේන්තුවේ උප සංස්කෘතිය හඳුනා ගැනීම. |
| 25 | කාන්තා නාවුක ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන (Women in maritime Security program) | ජුනි 3 - 6 | දින 04 | බලයලත් නිලධාරී 01 | - | විදේශීය (Australian Border Force) | එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියට අනුකූලව ජාත්‍යන්තර සමුද්‍රීය ආරක්ෂක නීතිය පිළිබඳ දැනුම හා භාවිතාව වර්ධනය කිරීම සහ ඕස්ට්‍රේලියාව හා ඊසානදිග ඉන්දියානු සාගර කලාපය පුරා සමුද්‍රීය ආරක්ෂාව සඳහා කාන්තා ජාලයක් ගොඩනැගීම. |
| 26 | Frontline leading for performance | ජුනි 3 - 7 | දින 05 | බලයලත් නිලධාරී 6 | - | විදේශීය (Australian Border Force) | විදේශීය අත්දැකීම් තුළින් පෞර්ෂ වර්ධනයට හා නිවැරදි තිරණ ගැනීමට පුහුණු කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 27 | Trusted Insider Treat Workshop | ජුනි 6 - 7 | දින 02 | බලයලත් නිලධාරී 5 | - | ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය | ශ්‍රී ලංකා ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ සිදුවන අභ්‍යන්තර තර්ජන, අවදානම්, ප්‍රතිවිපාක සහ සැක සහිත හැසිරීම් සහ ඒවා අවම කරගැනීමේ උපායමාර්ග පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම. |
| 28 | විධායක නිලධාරීන් සඳහා ආතති හරණය (Stress release) පුහුණු වැඩසටහන | ජුනි 15 - 16 | දින 02 | විධායක නිලධාරීන් | - | අනුග්‍රාහක | වෙහෙසකරී රාජකාරීකාරියෙන් මිදී මානසික හා කායික ආතතිය පාලනයටත්, සේවා කාර්යක්ෂමතාව හා නිලධාරීන් අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය වර්ධනය කිරීම. |
| 29 | Intelligence Foundation Workshop ( 2 Programs ) | ජුනි 10 – 14 ජුනි 17 - 21 | දින 05 | බලයලත් නිලධාරීන් 8 | - | විදේශීය (Australian Border Force) | නිලධාරීන්ගේ විමර්ශනය කෙරෙහි උනන්දුව වැඩ කිරීම. |
| 30 | මුහුදු මාර්ග ඔස්සේ සංක්‍රමණ ජාවාරම් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන (Smuggling of Migrants by Sea) | ජුනි 24 – ජූලි 5 | දින 14 | බලයලත් නිලධාරීන් 8 | - | විදේශීය ( JCLEC) | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මකව සහ මානව හිමිකම් ප්‍රවේශයන් භාවිතා කරමින් මුහුදු මාර්ගයෙන් සිදුවන සංක්‍රමණික ජාවාරම් වලට ප්‍රතිචාර දැක්වීමට අදාළ වන නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 31 | බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපල අධ්‍යයන චාරිකාව | ජුනි - 26 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 44,790 | දේශීය | ගුවන් තොටුපල හරහා වන මගී නිශ්කාෂණ (රටට ඇතුල්වීමේදී හා පිටවීමේදී) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම හා ඒ ආශ්‍රිත සේවාවන් හඳුනා ගැනීම. |
| 32 | බාහිර ක්ෂේත්‍රගත පුහුණුව (Out Bound Training) | ජුලි 13 - 14 | දින 02 | රියදුරු මහතුන් | 169,521 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරීයෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගීතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 33 | ශ්‍රී ලංකාවේ සමුද්‍රිය අපරාධ යුක්තිය පසඳලීමේ වෘත්තිකයන් අතර උපදේශන සාකච්ඡාව (Consultative Dialogue between Maritime Criminal Justice Practitioners on Developing a collaborative framework for evidence collection at sea & China custody procedures in Sri Lanka | ජුලි 15 -16 | දින 02 | බලයලත් නිලධාරීන් 01 | - | විදේශීය (UNODC) | ශ්‍රී ලංකාවේ මුහුදේ සිදුවන අපරාධවලට අදාළ සාක්ෂි එකතු කිරීම හා එම සාක්ෂි අධිකරණයට පිළිගත හැකි ලෙස ඉදිරිපත් කිරීම සහ සමාජික රාජ්‍යයන් අතර අන්තර් සහයෝගීතා රාමුවක් සකස් කිරීම. |
| 34 | ආගමන හා විගමන දෙපාර්තමේන්තු ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ජුලි 19 - 22 | දින 02 | ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවාගත් නවක නිලධාරීන් | 11, 695 | - | ශ්‍රී ලංකා විදේශ දූත සේවයට අළුතින් බඳවාගත් නිලධාරීන් සඳහා මෙම දෙපාර්තමේන්තු ක්‍රියාවලිය පිළිබඳ හා ආගමන විගමන පනත සම්බන්ධයෙන් දැනුවත් කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 35 | ගමන් බලපත් අංශයේ නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | ජූලි 27 - 28 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 457,920 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරියෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 36 | ලංසු ඇගයීම (Bid Evaluation) පිළිබඳ සම්මන්ත්‍රණය | ජූලි - 31 | දින 01 | සං. නි / ක. සේ. නි - | 26, 975 | දේශීය ( PRAG Service ) | රාජ්‍ය මුදල් අපතේ යාම වළක්වාලමින්, නිවැරදි නෛතික රාමුවක් තුළ නිසි ක්‍රමවේදයන් අනුගමනය කරමින් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සම්බන්ධව දැනුවත් වීම. |
| 37 | පුද්ගල ජාවරම් සහ මිනිස් ජාවාරම් විමර්ශනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන (People Smuggling & Human Trafficking Investigation program) | අගෝස්තු 5 - 16 | සති 02 | බලයලත් නිලධාරීන් 04 | - | විදේශීය (Australian Federal Police) | මිනිස් ජාවාරම් හා පුද්ගල ජාවාරම් සම්බන්ධයෙන් විමර්ශණය කිරීම හා නඩු පැවරීම සම්බන්ධයෙන් අවබෝධය ලබා දීම. |
| 38 | ගමන් බලපත් අංශයේ, වීසා අංශයේ සහ පුරවැසි අංශයේ සිදුවූ යාවත්කාලීන වීම් සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන | අගෝස්තු 7,9,14,16, 21,23 | මාස 01 | බලයලත් නිලධාරීන් | 49, 225 | දේශීය | ගමන් බලපත්‍ර, වීසා හා පුරවැසි අංශයන්හී සිදුවූ යාවත්කාලීන වීම් සම්බන්ධයෙන් තොටුපල හා වරායන්හී සේවයේ නියතු බලයලත් නිලධාරීන් දැනුවත් කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 39 | ජාත්‍යන්තර පුද්ගල ජාවාරම් විමර්ශන සම්බන්ධ වැඩසටහන (International People Smuggling Investigations Program) | අගෝස්තු 19 - 30 | සති 02 | බලයලත් නිලධාරීන් 1 | - | විදේශීය ( JCLEC) | මිනිස් ජාවාරම් පිළිබඳ අවබෝධ කර ගැනීම, මෙම අපරාධ වර්ගවලට සම්බන්ධ අනෙකුත් ආයතන වල කාර්යභාර්ය අවබෝධකර ගැනීම සහ විදේශීය නීති බලාත්මක කිරීම. |
| 40 | පුරවැසි අංශයේ නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | අගෝස්තු 24 - 25 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 220,860 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරීයෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතති පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 41 | Training program for recognizing people from photographs ( ඡායාරූප මගින් පුද්ගලයන් හඳුනාගැනිම) | අගෝස්තු 29 | දින 01 | විධායක හා මාණ්ඩලික නිලධාරීන් 30 | 10, 200 | දේශීය/ විදේශීය | ඡායාරූප මගින් නිරවද්‍ය ලෙස පුද්ගල අනන්‍යතාවය හඳුනාගැනීම සඳහා පුහුණුව ලබාදීම. |
| 42 | නැගෙනහිර ඉන්දියන් සාගරයේ මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ පද්ධති විශ්ලේශණය හා කලාපීය සාකච්ඡාව (Regional Round Table & Systems Analysis Exercise on Mapping Drug Trafficking Network in the East Indian Ocean) | අගෝස්තු 27 - 30 | දින 04 | බලයලත් නිලධාරී 01 | - | විදේශීය (UNODC) | අන්තර් ආයතන සහ ජාත්‍යන්තර සහයෝගීතාවය මගින් මත්ද්‍රව්‍ය ජාවාරම් විමර්ශනය කිරීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ විශ්ලේෂණ හැකියාව වැඩි දියුණු කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 43 | විදේශ දූත මණ්ඩල අංශයේ නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | සැප්තැම්බර් 7 - 8 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 214,795 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරියෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය , ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 44 | සයිබර් ආරක්ෂාව (Cyber Security) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - I | ඔක්තෝබර් 28 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 35, 200 (වැඩසටහන් 02 සඳහා) | දේශීය | සයිබර් අවකාශය තුළදී සිදුවිය හැකි අනතුරු (Hacking, phishing) වලින් වැලකීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම . |
| 45 | පරිගණක පුහුණු වැඩසටහන (වැඩසටහන් 01) | ඔක්තෝබර් 30 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 43, 200 | දේශීය | නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීමේ අරමුණින් MS Office, Excel, Word සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම. |
| 46 | ගිණුම් අංශයේ නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | නොවැම්බර් 2 - 3 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 305,393.60 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරියෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය , ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 47 | සයිබර් ආරක්ෂාව (Cyber Security) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - II | නොවැම්බර් 5 | දින 01 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | - | දේශීය | සයිබර් අවකාශය තුළදී සිදුවිය හැකි අනතුරු (Hacking, phishing) වලින් වැලකීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම . |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 48 | පරිගණක පුහුණු වැඩසටහන (වැඩසටහන් 02) | නොවැම්බර් 5 සහ 12 | දින 02 | සේවාවන්ට අයත් නිලධාරීන් | 34,985 | දේශීය | නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීමේ අරමුණින් MS Office, Excel, Word සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම. |
| 49 | ලේඛන සත්‍යාපනය (Document Verification) කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | නොවැම්බර් 20,21 සහ 22 | දින 03 | බලයලත් නිලධාරීන් 20 | 49,225 | දේශීය/ විදේශීය (Swiss Embassy) | ගුවන් ගමන් බලපත්‍ර හා අනෙකුත් ලේඛන වල සත්‍යතාව, නිරවද්‍ය භාවය හා නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීම හා විශ්වාසදායක බව තහවුරු කිරීම. |
| 50 | තොරතුරු තාක්ෂණ අංශයේ සහ ප්‍රදේශීය කාර්යාල වල නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | නොවැම්බර් 23 - 24 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 316,071.24 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරියෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාව, ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |
| 51 | වීසා අංශයේ නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | දෙසැම්බර් 07 - 08 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 197,670 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරීයෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාව, ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |

| | වැඩසටහනේ නම | කාල සීමාව | වැඩසටහනේ කාල සීමාව | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | සමස්ථ ආයෝජන (රු.000) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශිය ) | නිමැවුම ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| 52 | පැය 200 දෙමළ භාෂා පාඨමාලාව | දෙසැම්බර් 11 | පැය 200 | බලයලත් නිලධාරීන් 49 | 735,000 | දේශීය | රාජ්‍ය සේවා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව නිලධාරීන්ගේ භාෂා කුසලතාව ඉහළ නැංවීම හා ඒ මගින් මහජන සම්බන්ධතාවය වර්ධනය කිරීම හා වඩාත් යහපත් සේවාවක් ලබා දිම. |
| 53 | පාලන, ප්‍රසම්පාදන සහ ප්‍රතිපත්ති අංශයේ නිලධාරීන් සඳහා බාහිර ක්ෂේත්‍රගත පුහුණුව | දෙසැම්බර් 21 - 22 | දින 02 | සියළුම සේවාවන්ට අයත් නිලධාරීන් | 291,070 | දේශීය | ඒකාකාරී හා කාර්යය බහුල රාජකාරියෙන් මිදී නිලධාරීන්ගේ සේවා කාර්යක්ෂමතාවය, ආතතී පාලනය, අන්තර් පුද්ගල සහයෝගිතාවය හා අභිප්‍රේරණය වර්ධනය කිරීම. |

# 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකාපොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | - අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | - අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | - අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | - අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | - අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තෙමින්තුවට ඉදිරිපත් කර තිබීම. | - අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | - අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | - අනුකූල වේ | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8** | වත්කම් කළමනාකරණය | | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| **9** | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | - | - | - |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ සක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බබන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල නොවේ. | - | - |
| **12** | **රජයේ නිලධාරීන් ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සේවය හැරගිය, වැඩ තහනම්කල සහ විශ්‍රාම ගිය නිලධාරීන් ගේ ණය ශේෂ අයකරගෙන අවසන් නොවීම | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘති පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම. | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |